# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,550 — 1965 නොවැම්බර් 5 වැනි සිකුරාදා — 1965.11.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය | — | ආණ්ඩුවේ නිවේදන | 1565 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය | 1561 | මිළ පාලන දැන්වීම | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1562 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1563 | ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා | — |
| වෙනත් පත් කිරීම් ආදිය | 1564 | ආණ්ඩුවේ වත්කම හා බැරකම් ප්‍රකාශ | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | 1575 |
| | | "පුරාබද්ධ ආඥාපනත" පිළිබඳ දැන්වීම් | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 403.

අංකය: සී/විඑෆ්/මිශ්‍ර/132.

### යුධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරරයට පත් කිරීම හා උසස් කිරීම

**පත් කිරීම**

1965 පෙබරවාරි 23 වෙනි දින සිට පහත නම සඳහන් මහතා යුද හමුදාවේ ලංකා ස්වේච්ඡා බල සේනාවේ උප ලුතිනන් කෙනෙකු වශයෙන් අධිකාරයට පත් කිරීම හා එම දින සිට 4 වෙනි සංවිධාන හා නිර්මාන රෙජිමේන්තුව, ලංකා ඉංජිනේරු (ස්වේච්ඡා) වට ඇතුළත් කිරීම් අග්‍රාණ්ඩුකාර උතුමාණ[illegible] [illegible]න්සේ විසින් අනුමත කරන ලදී.

සිසිල් මාසල් ෙ[illegible]

[illegible]රේරා
[illegible]. බර්නාඩ්[illegible]
[illegible]නුවරඑළිය[illegible]
[illegible]ගන, [illegible]
[illegible]මගේ[illegible]
[illegible]ට වැඩ [illegible]

**උසස් කිරීම**

1965 පෙබරවාරි 23 වෙනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් වශයෙන් :—

උප ලුතිනන්, සිසිල් මාසල් පෙරේරා, ලං. ඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. ජේ. වී. පී. බබිලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් 26 දින,
කොළඹ දීය.

11-220

## විශෙෂ නිවේදනයයි

1965 [illegible]ැම්බර් 8 වැනි සඳුදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන [illegible]න්, 1965 නොවැම්බර් 12 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1965 නොවැම්බර් 6 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 ඔක්තෝබර් 29 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

1965 අංක 404

අංකය : ඞී/වීඑප්/18/ඒ(II).

**රාජකීය ලංකා නාවික හමුදුව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

රාජකීය ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ වෛද්‍ය ප්‍රතිනත් කොමාන්ඩර් කේ. ද අල්විස්, 1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට වෛද්‍ය කොමාන්ඩර් පදවියට උසස් කිරීම අනුමත කිරීමට අති ගරු අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ප්‍රසාදය පළකර ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් 22 වෙනි දින,
කොළඹ දිය.

11-13/2

---

1965 අංක 405

අංකය : ඞී/වීඑප්/18/ඒ (II)

**රාජකීය ලංකා ස්වේච්ඡා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද රාජකීය ලංකා ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්**

රාජකීය ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ වෛද්‍ය කොමාන්ඩර් ජේ. එෆ්. සිල්වා, 1965 සැප්තැම්බර් 12 දින සිට රාජකීය ලංකා ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කොට ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් 22 දින,
කොළඹ දිය.

11-13/1

---

1965 අංක 406

මගේ අංකය : 56/3 වැ. සහ අ.වි.

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපණතේ (431 වැනි අධිකාරිය) අංක 5 (3) දරණ ඡේදය යටතේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල හා ක්‍රමය පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සිටි ඇර්. පී. රත්නතුංග මහතාගේ පත්වීම අවලංගු කිරීමෙන් හා ඉවත් කිරීමෙන් ඇතිවූ පුරප්පාඩුව පිරවීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ සී. ඇල්. වී. ඒ. ඒ. පතමිබලන මහතා 1965 ජූනි 10 වන දින සිට පත්කර තිබේ.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ අණපරිදි,

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1965 ඔක්තෝබර් 15 වැනිද,
කොළඹ, මුදල් ඇමති කාර්යාලයේ දී.

11-176/2

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 407

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් කරන ලෙස නියම කර ඇත:—

ඒ. 87/64.

ඩබ්ලිව්. එල්. පී. ද මැල් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ හෝ නැවත නියමයක් කරන තුරු හෝ සහකාර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ (ගගන යාත්‍රාගත) කපිතාන් සී. එච්. ඇස්. අමරසේකර මහතා සිය රාජකාරිවලට අතිරේකව 1965 සැප්තැම්බර් මස 10 වැනි දින සිට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ හා ගුවන් යානා රෙජිස්ට්‍රාර් තනතුරෙහි රාජකාරියයන් ඉටු කිරීමට.

ඒ. 370/64.

ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් ලංකා පරිපාලන සේවයේ කේ. සිත්තම්පලම් මහතා 1965 සැප්තැම්බර් මස 16 වැනි දින සිට ජේ. වී. ෆොන්සේකා මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ හෝ නැවත නියමයක් කරන තුරු හෝ ගොවිජන සේවා කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 161/65.

ලංකා පරිපාලන සේවයේ එම්. ඩබ්ලිව්. එස්. ගුණරත්න මහතා 1965 ඔක්තෝබර් මස 5 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ආයුර්වේද කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒඒ. 53/65.

සහකාර අධ්‍යක්ෂ වී. ගුණරත්නම් මහතා 1965 ඔක්තෝබර් මස 12 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු රජයේ මැඩ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 173/65.

ලංකා පරිපාලන සේවයේ එම්. සී. සී. ප්‍රනාන්දු මහතා, 1965 මාර්තු මස 27 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු පළාත් පාලන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 141/65.

ගණකාධිකාරි සේවයේ ඒ. ජී. වී. විජේසේකර මහතා 1965 මාර්තු මස 27 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒ. 355/64.

ලංකා පරිපාලන සේවයේ ජී. ඒ. ඇස්. ගතේපොල මහතා, බදුල්ලේ සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් සිය රාජකාරිවලට අතිරේකව, 1965 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මොණරාගල සහකාර මැතිවරණ නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 355/64.

ලංකා පරිපාලන සේවයේ ඇස්. ඇන්. රාජා මහතා අනුරාධපුරය සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් සිය රාජකාරිවලට අතිරේකව, 1965 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ත්‍රිකුණාමලයේ සහකාර මැතිවරණ නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 355/64.

ලංකා පරිපාලන සේවයේ වී. පී. කරුණාරත්න මහතා මහනුවර සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් සිය රාජකාරිවලට අතිරේකව 1965 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු නුවරඑළියේ සහකාර මැතිවරණ නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 355/64.

ලංකා පරිපාලන සේවයේ [illegible] කේ. චන්ද්‍රානන්ද මහතා මාතර සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් සිය රාජකාරිවලට අතිරේකව, 1965 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු හම්බන්තොට සහ[illegible]රණ නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 355/64.

ලංකා පරිපාලන සේවයේ ආර්. අ[illegible] මහතා අම්පාරේ සහකාර මැතිවරණ නිලධාරි [illegible] රාජකාරිවලට අතිරේකව, 1965 ජූලි මස 1 [illegible] නැවත නියමයක් කරන තුරු මඩකලපුවේ සහකාර මැතිවරණ නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 355/64.

ලංකා පරිපාලන සේවයේ ඇම්. ආර්. ගණපති මහතා, කුරුණෑගල සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් සිය රාජකාරිවලට අතිරේකව, 1965 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මාතලේ සහකාර මැතිවරණ නිලධාරි ලෙස වැඩ බැලීමට.

ඒ. 73/64.

ලංකා පරිපාලන සේවයේ ඩබ්ලිව්. වී. බී. බොතේජු මහතා 1965 ජනවාරි මස 29 වැනි දින සිට තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ පාලන සහකාර තනතුරෙහි වැඩ බැලීමට.

ඒ. 73/64.

ලංකා පරිපාලන සේවයේ පී. ඩී. ඇම්. පෙරේරා මහතා 1965 ජනවාරි මස 29 වැනි දින සිට තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ පාලන සහකාර (අනියම්) තනතුරෙහි වැඩ බැලීමට.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 නොවැම්බර් මස 1 වැනි දින,
කොළඹ 1,
ගාලු මුවදොර ඔහි ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය.
තැ. පෙ. අංක 500.

11-196

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 408

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : සීජේපී/එස්. 26/61.

ජේ. බී. සී. ස්වාරිස් මහතා 1962 මාර්තු මස 8 වැනි දින සිට, ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් පත්කිරීම ස්ථිර කර ඇත.

අංකය : ජේඑස්සී/පීපී. 11/65.

එම්. එස්. ඒ. හසන් මහතා 1965 ඔක්තෝබර් 27 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධිකරණ සේවයේ වැඩ බලන නිලධාරියෙකු වශයෙන් සහ අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ එස්. බී. ගුණවර්ධන මහතා නිවාඩු පිට සිටින අතර හෝ නැවත නියමයක් කරන තුරු 1965 ඔක්තෝබර් 27 වැනි දින සිට 1965 නොවැම්බර් 8 වැනි දින දක්වා, අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට පත් කර ඇත.

අංකය : ජේඑල්. 49/48.

එස්. එන්. රුද්‍රදුරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1965 ඔක්තෝබර් 21 වැනි දින සිට 25 වැනි දින දක්වා, අනුරාධපුර දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 71/ඒ/51.

ඩී. විමලරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උඩලාගම මහතා 1965 ඔක්තෝබර් 20 වැනි දින හා 1965 නොවැම්බර් 1 වැනි දින, කෑගල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 10. ඒ/53.

ටී. එෆ්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බර්තෝලමියුස් මහතා 1965 නොවැම්බර් මස 4 වැනි දින, නුවරඑළියේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 26/50.

ඒ. බී. ජේ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1965 නොවැම්බර් 5 වැනි, 6 වැනි, 12 වැනි, 13 වැනි, 19 වැනි හා 20 වැනි දිනයන්හි බලපිටියේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 40. ඒ/60.

සී. එල්. ටී. මුනමල්ලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. එස්. එම්. වැන්ඩර්කෝන් මහතා 1965 නොවැම්බර් 2 වැනි දින, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 29. ඩී/611.

එස්. බී. ජයසුන්දර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1965 ඔක්තෝබර් 29 වැනි දින සිට 1965 නොවැම්බර් 1 වැනි දින දක්වා, තංගල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, මහෙස්ත්‍රාත් තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ජී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. බැස්ටියන්ස් මහතා 1965 නොවැම්බර් 1 වැනි හා 17 වැනි දිනයන්හි, මාතර මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 23. ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1965 නොවැම්බර් 12 වැනි දින සහ 1965 නොවැම්බර් 17 වැනි දින සිට නැවත වැඩ භාරගන්නා තුරු, පී. එස්. බුල් මහතා හම්බන්තොට මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 4. ඒ/63.

ජී. එෆ්. එච්. අතුරුපාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එලියතම්බි මහතා 1965 ඔක්තෝබර් 26 වැනි දින සිට 30 වැනි දින දක්වා, මල්ලාකම්හි ක්‍රියා කරන පිණිස යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, මල්ලාකම්හි ළමා මහෙස්ත්‍රාත් තැන සහ යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 11/64.

එස්. ජේ. ඩී. ද එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ආර්. ඩී. ඒ. ගුණතිලක මහතා 1965 ඔක්තෝබර් 22 වැනි, 25 වැනි හා 26 වැනි දිනයන්හි, කළුතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. ආර්. 9/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සී. කතිරවේලු මහතා 1965 නොවැම්බර් 1 වැනි දින සිට 3 වැනි දින දක්වා, යාපනේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, කයිට්ස්හි මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 68. ඩී/50.

ඩබ්ලිව්. ඒ. බෝල්ඩ්වින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ආර් ඩී. ඒ. ගුණතිලක මහතා 1965 ඔක්තෝබර් 27 වැනි දින සිට 30 වැනි දින දක්වා, කළුතර, මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 1/48.

එල්. ඒ. පී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. ඩබ්ලිව්. තිසේරා මහතා 1965 නොවැම්බර් 3 වැනි, 5 වැනි සහ 6 වැනි දිනයන්හි, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ නැගෙනහිර, සියනෑ කෝරලේ බටහිර (මැද පත්තු) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා දකුණු අළුත්කුරු කෝරලේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 1/48.

එල්. ඒ. පී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. අමරතුංග මහතා 1965 නොවැම්බර් 4 වැනි දින, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ නැගෙනහිර, සියනෑ කෝරලේ බටහිර (මැද පත්තු) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා දකුණු අළුත්කුරු කෝරලේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 1/48.

එල්. ඒ. පී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඒ. සුබසිංහ මහතා 1965 නොවැම්බර් 9 වැනි දින, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ නැගෙනහිර, සියනෑ කෝරලේ බටහිර (මැද පත්තු) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා දකුණු අළුත්කුරු කෝරලේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/එච්. 5/56.

සී. බී. හුනුකුඹුර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඩබ්ලිව්. එම්. බුලන්කුලම මහතා 1965 ඔක්තෝබර් 26 වැනි හා 27 වැනි දිනයන්හි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමන්කඩුව, කලාගම් පලාත උතුර සහ කලාගම් පලාත දකුණ ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා දකුණු නුවරගම් පලාතේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්. 5/57.

එච්. එස්. අගලවත්ත මහතා 1965 නොවැම්බර් 3 වැනි දින සිට, බෙල්ලන ගම්බද උසාවියේ අංක 7 දරණ වාරිමාර්ග නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කළුතර දිස්ත්‍රික්කයේ බටයිර පස්දුන් කෝරලේ, මහ පත්තුවේ, ගහබොඩ පත්තුවේ සහ කළුතර තොටමුණේ ආදායම් පාලක නිලධාරීන්ගේ කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පිඑල්/අයි. 4/52.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, යූ. රත්නායක මහතා 1965 ඔක්තෝබර් 29 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ හාරිස්පත්තු, පාත සහ උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/වී. 2/50.

ඩී. බී. විතාරන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. පී. ද සිල්වා මහතා 1965 ඔක්තෝබර් 29 වැනි හා 30 වැනි දිනයන්හි, බලපිටිය දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරළේ සහ වැල්ලබොඩ පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සී. ඊ. ජයවර්ධන,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 ඔක්තෝබර් මස 29 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

11-175

## වෙනත් පත්කිරීම් ආදිය

### 1965 අංක 409

ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇත :—

75/4/18/7 (එම්.සීඑ)

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ ආර්. පස්කරලිංගම් මහතා, නැවත නියමයක් කරන තුරු, 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

75/4/37 (එම්සීඑ)

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ ටී. සැමුවෙල් තම්බයියා මහතා, නැවත නියමයක් කරනතුරු, 1965 අගෝස්තු මස 16 වැනි දින සිට මඩකලපුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

75/10/592 (එම්සීබී)

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ එම්. බී. වීරරත්න මහතා 1965 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉඩම් සංවර්ධන නිලධාරියෙකු වශයෙන්.

75/10/256 (එම්සීබී)

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ පී. ධර්මරාජා මහතා 1965 මාර්තු මස 27 වැනි දින සිට 1965 අගෝස්තු මස 1 වැනි දින දක්වා, වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වශයෙන්.

75/10/838 (එම්සීබී)

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ එච් පී. විරසේකර මහතා 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ ලේකම් වශයෙන්.

කෙ. ජිනදාස සමරක්කොඩි,
භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය, කොළඹ,
1965 ඔක්තෝබර් මස 25 වැනි දින.

11-5

### 1965 අංක 410

අතිගරු අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව, එතුමා විසින්—

අංක : පා. 4/සාවි. 30/3.

1. අසන්කුදූස් මරික්කාර් මොහමඩ් අලි මරික්කාර් මහතා පුත්තලම් අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කරුවකු වශයෙන් ද,

අංකය : පා. 4/සාවි. 2/32.

2. ලියනාරච්චිගේ පැට්‍රික් හැම්බට් ද සිල්වා මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 37/19.

3. අහමඩ් ජමාල්දීන් මොහමඩ් ඉස්මායිල් මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 37/12.

4. කුමාරසිරි වීරසිංහගේ ප්‍රැන්සිස් කුලතිලක මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 37/14.

5. කැල්ල ගමගේ රූපසේන මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 12/4.

6. අබ්දුල් වහාබ් මොහමඩ් සලාහුදීන් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : ඒ. ජේ. 25/63/6.

7. ජේ. කේ. වේඑපිල්ලෙයි මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : ඒ. ජේ. 14/3/61.

8. නාග කන්කානම්ගේ පීටර් ද සිල්වා මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.11.1 වෙනි දින,
අධිකරණ අමාත්‍යාංශයේදීය.

11-221

### 1965 අංක 411

(20 වෙනි පරිච්ඡේදය) වන ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

මගේ අංක : ඒඅයි. 9/4/62.

1. 1965.8.12 වෙනි දින සිට යාපනේ දිස්ත්‍රික්කයේ මයිලිඩ්ඩි උඩයාර් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් එන්. සුන්දරමූර්ති මහතා ද,

අංක : ඒඅයි. 18/1/63.

2. 1965.10.22 වෙනි දින සිට රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර නගර සභා සීමාව තුළ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් මුද්දුව ගමේ ඇතිගේ පුංචි මයන්මිණ ද,

3. 1965.10.22 වෙනි දින සිට රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර නගර සභා සීමාව තුළ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් වින්ස්ටන් ලෙනාර්ඩ් මාලවංශ මහතා ද,

අංක : පා. 4/හමප. 16/1.

4. 1965.10.18 වෙනි දින සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ උඩුකහ දකුණු කෝරලේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් සමරවීරගේ බේලින් වෛද්‍යරත්න මහතා ද, පත්කර ඇත්තේය.

අංක : පා. 4/හමප. 17/1.

5. කල්පිටිය ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ, භූමිදානය කරන ලද මෘත ශරීරයක් ගොඩ ගැනීමට නියෝග කිරීමේ බලය නොමැතිව, දිස්ත්‍රික්කයේ වෛද්‍ය නිලධාරියකුට හෝ වෙනත් වෛද්‍ය නිලධාරියෙකුට මෘත ශරීරයක් කපා පරීක්ෂා කිරීම සඳහා නියෝග කිරීමට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 365 (1) වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින් ඒ. එම්. මදූර් මරික්කාර් මහතා වෙත බලය පවරා ඇත.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965.11.1 වෙනි දින,
අධිකරණ අමාත්‍යාංශයේ දිය.

11-222

---

1965 අංක 412

## දැන්වීමයි

රාහුබද්දෙ කන්කානන්ගේ රෙජිනෝල්ඩ් ද සිල්වා රාමචන්ද්‍ර මහතා බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු විළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

11-9

---

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංක ඩබ්ලිව්. 49

ඇල්.ඩී.—බී. 125/50

### නාවික හමුදා පනත

21 (1) වෙනි වගන්තිය යටතේ ආඥාව

1962 අංක 8 දරන පනතින් සංශෝධිත (358 වෙනි අධිකාරය වන) නාවික හමුදා පනතෙහි 21 වෙනි වගන්තියෙහි (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව වන මම, ඒ උප වගන්තිය යටතේ පනවනු ලැබ 1963 ඔක්තෝබර් 18 වැනි දින අංක 13,795 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාව, ඒ ආඥාවේ "ධීවර දෙපාර්තමේන්තුවට අයත් ධීවර යාත්‍රා" යන වචන වෙනුවට "ලංකා ධීවර නීතිගත සංස්ථාවට අයත් ධීවර යාත්‍රා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
කොළඹ, 1965 ඔක්තෝබර් 28 වැනි දින.

11-35

---

මගේ අංකය : 56/3 වැ. සහ අ.වී.

## දැන්වීමයි

ආර්. පී. රත්නතුංග මහතා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල හා ක්‍රමය පිළිබඳ සංස්ථාවේ උසුලන ලද අධ්‍යක්ෂ පදවියෙන් 1965.6.10 දින සිට ඉල්ලා අස්වීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති හෙයින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ (431 වැනි අධිකාරිය) අංක 5 (2) දරණ ඡේදය යටතේ අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, ඒ මහතාගේ පත්වීම එදින සිට අවලංගු කර නිෂ්ප්‍රභා කර තිබේ.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1965 ඔක්තෝබර් 15 දින,
කොළඹ, මුදල් ඇමති කාර්යාලයේ දී.

11-176/1

---

ඇල්.ඩී—බී. 129/47.

අංක සී.25/65.

## 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාව

61 වන වගන්තිය යටතේ ආඥාව

1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 61 වන වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද ආඥාව.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹදිය.

### අංක 170 දරන ආඥාව

1. වර්ෂයකට විශ්‍රාම වැටුප් හිමි වේතන රු. 2,700 ට වැඩි නොවන හෝ විශ්‍රාම වැටුප් අහිමි වේතන රු. 3,180ට වැඩි නොවන, මීට අමුණා ඇති උප ලේඛනයේ I වන තීරුවෙහි දක්වෙන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ යම නිලධාරියකුට තරවටු කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ සතියක වැටුපට වැඩි නොවන දඩයක් පැනවීමේ බලය, එම උපලේඛනයේ II වන තීරුවෙහි අනුරූප සටහනේ දක්වෙන ඒ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මෙයින් පවරා දෙනු ලැබේ :—

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කළ හැකි උපදෙස් අනුව එම බලතල ක්‍රියාවේ යෙදවිය යුතුය.

(ආ) මෙ ආඥාව යටතේ පවරනු ලැබූ බලතල අනුව එවැනි නිලධාරියකු විසින් කරනු ලැබූ තීරණය පිළිබඳව සෑහීමට පත් නොවූ යම් කෙනකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ආයාචනයක් ඉදිරිපත් කළ හැකිය.

(ඇ) නිලධාරියකුට පවරනු ලැබූ දඬුවම් දීමෙ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාවේ යෙදවිය යුතු යයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එම බලතල ඒ නිලධාරියා විසින් එම අවස්ථාවේදී ක්‍රියාවේ යෙදවිම නොකළ යුතුය.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනය කිරීම සඳහා 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවෙ 61 වැනි වගන්තියෙන් පැවරුනු අයිතිවාසිකම් හීන කිරීමක් හෝ ඒ අයිතිවාසිකම කෙරෙහි අන්ලෙසකින් බලපෑමක් හෝ මෙ ආඥාවෙහි සඳහන් කිසිවකින් සිදුවෙතැයි නොසැලකිය යුතුය. නැතහොත් එලෙස තේරුම් නොගත යුතුය.

3. 1958 අගෝස්තු 1 වන දින අංක 11,465 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඉක්බිතිව සංශෝධිත අංක 112 දරන ආඥාවෙහි උපලේඛනය, ගුවන් විදුලි සහ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් වූ කරුණු අතහැරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## උපලේඛනය

### I වැනි තීරය

II වැනි ශ්‍රේණියේ විධායක ලිපිකාර පන්තියේ නිලධාරීහු හා සාමාන්‍ය ලිපිකාර සේවයේ සාමාන්‍ය ලිපිකාර පන්තියේ නිලධාරීහු
ලඝුලේඛකයෝ
යතුරු ලේඛකයෝ
II වැනි ශ්‍රේණියේ භාෂා පරිවර්තකයෝ
III වැනි ශ්‍රේණියේ සරප්
පොත් තබන්නෝ
පිටපත් යන්ත්‍ර ඔපරේටර්වරු
බයිසිකල් ඕඩර්ලිවරු
කාර්යාල කාර්ය සහායකයෝ
පිළිගැනුම්කරුවෝ
කම්කරු පරිපාලකයෝ
ටෙලිපෝන් ඔපරේටර්වරු
පොත් බඳින්නෝ
ප්‍රවාහන නිලධාරියා
රියැදුරෝ
මුරකරුවෝ
ක්ලීනර්වරු
උයන්ගොවි
උයන්ගොවි කම්කරු
කාර්යාල කම්කරුවෝ
මැදිරි කම්කරුවෝ
කසල ශෝධක කම්කරුවෝ
ගබඩා භාරකරු
කොට්ඨාශ ගබඩා භාරකරු
සහකාර ගබඩා භාරකරුවෝ
II වැනි සහ III වැනි ශ්‍රේණියේ කාර්මික සහකාරවරු
කණිෂ්ඨ කාර්මික සහකාරවරු
සැළසුම්කරු
වායු සමීකාරී යන්ත්‍රාගාර ජ්‍යෙෂ්ඨ ඔපරේටර්
I වැනි සිට V වැනි පංතිය දක්වාවූ කම්කරුවෝ
II වැනි පංතියේ ලයින්මන්
ජ්‍යෙෂ්ඨ මැදිරි සේවකයෝ
මැදිරි සේවකයෝ
ගුවන් විදුලි වාර්තාකරුවෝ
කණිෂ්ඨ වැඩසටහන් සහකාරවරු (පාසැල්)
ලිපි සම්පාදකයෝ
වැඩසටහන් විස්තර හා නිබන්ධ සම්පාදකවරු
නිවේදකයෝ
ප්‍රධාන තැටිගබඩා භාරකරු
තැටි ගබඩා භාරකරු
අතිරේක තැටි ගබඩා භාරකරු
තැටිගබඩා සහකාරවරු
උපලේඛන සහකාර
සහකාර උපලේඛන සහකාරවරු
වැඩසටහන් සම්පාදක සහකාරවරු
වැඩසටහන් සම්පාදක පරිපාලකවරු
වෙළඳ වැඩසටහන් සම්පාදක පරිපාලකවරු
පිටපත් කිරීම් හා ලේඛන වැකර්
කාර්මික සහකාර සහ ඡායාරූප ශිල්පී
සහකාර ඡායාරූප ශිල්පී
පුස්තකාලයාධිපති
අසුරන්නෝ
විකුණුම් සහකාරවරු
අඳුරු කාමර උපස්ථායකයෝ
II වැනි ශ්‍රේණියේ කැමරා නඩත්තු ශිල්පීහු
II වැනි ශ්‍රේණියේ සහකාර ශබ්ද කාර්මිකයෝ
සහකාර ශබ්ද සටහන්කරු
සහකාර චිත්‍රපට සංස්කාරක
නෙගටිව් කපන්නෝ
චිත්‍රපටි ඇඳන්නා
චිත්‍රපටි භාරකරුවෝ
එළිය සැපයීම හා නඩත්තු කාර්මික
ප්‍රක්ෂේපණ සටහන්ගාර ක්‍රියාකරවන්නෝ
සහකාර එළිය සැපයීම් හා නඩත්තු කාර්මික
චිත්‍රපටි ප්‍රදර්ශකයෝ
සහකාර චිත්‍රපටි ප්‍රදර්ශකයෝ
චිත්‍ර ශිල්පීහු
යුනිට් සහකාරයෝ
සැළසුම සහකාරයෝ
III වැනි ශ්‍රේණියේ රසායනාගාර සහකරුවෝ
II වැනි ශ්‍රේණියේ රසායනාගාර සේවක
III වැනි ශ්‍රේණියේ මිකැනික්

### II වැනි තීරය

ගුවන් විදුලි සේවා සහ ප්‍රවෘත්ති සහකාර අධ්‍යක්ෂ ජනරාල්
ප්‍රධාන ගණකාධිකාරි
ගණකාධිකාරිවරු
පාලන සහකාර
ප්‍රධාන ඉංජිනේරු
සහකාර ඉංජිනේරුවරු
රජයේ ප්‍රකාශන කායර්‍යාංශයේ අධිකාරි
ගුවන් විදුලි අධ්‍යක්ෂ (ස්වදේශීය සේවය)
ගුවන් විදුලි අධ්‍යක්ෂ (වෙළඳ සේවය)
අතිරේක අධ්‍යක්ෂ (වෙළඳ සේවය)
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
රජයේ චිත්‍රපටි අංශයේ අධ්‍යක්ෂ

**I වැනි තීරය**

වඩු කමකරු
ප්‍රවෘත්ති සහකරුවෝ
ශෝධ්‍ය පත්‍ර බලන්නෝ
සිංහල වාදක මණ්ඩලයේ ප්‍රධානියා
ධ්වනි මණ්ඩන සහකාර
සහකාර තැටිගබඩා භාරකරු
බලාගාර අධිකාරි
පුහුණුව ලබන කාර්මික සහකරුවෝ
පුහුණුව ලබන කණිෂ්ඨ කාර්මික සහකරුවෝ
II වැනි ශ්‍රෙණියේ සුළු පරිපාලක
චිත්‍රපටි සංස්කාරක
ගණක යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ
උපලේඛන පරිපාලක
මුරකරු පරිපාලකවරු
මෝටර් යාන්ත්‍රිකයෝ

**II වැනි තීරය**

ගුවන් විදුලි සේවා සහ ප්‍රවෘත්ති සහකාර අධ්‍යක්ෂ ජෙනරාල්
ප්‍රධාන ගණකාධිකාරි
ගණකාධිකාරිවරු
පාලන සහකාර
ප්‍රධාන ඉංජිනේරු
සහකාර ඉංජිනේරුවරු
රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි
ගුවන් විදුලි අධ්‍යක්ෂ (ස්වදේශීය සේවය)
ගුවන් විදුලි අධ්‍යක්ෂ (වෙළඳ සේවය)
අතිරේක අධ්‍යක්ෂ (වෙළඳ සේවය)
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
රජයේ චිත්‍රපටි අංශයේ අධ්‍යක්ෂ

11–42

---

ඇල්. සී.—සී 129/47 අංක සී. 23/65

## 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාව

### 61 වන වගන්තිය යටතේ ආඥාව

1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 61 වන වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද ආඥාව.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දීය.

### අංක 171 දරන ආඥාව

1. වර්ෂයකට විශ්‍රාම වැටුප් හිමි වේතන රු. 2,700 ට වැඩි නොවන හෝ විශ්‍රාම වැටුප් අයිති වේතන රු. 3,180 ට වැඩි නොවන, මීට අමුණා ඇති උපලේඛනයේ I වන තීරුවෙහි දක්වෙන මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියකුට තරවටු කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ සතියක වැටුපට වැඩි නොවන දඩයක් පැනවීමේ බලය, එම උපලේඛනයේ II වන තීරුවෙහි අනුරූප සටහනේ දක්වෙන ඒ දෙපාර්තමේන්තුවේ නිලධාරියාට හෝ නිලධාරීන්ට පහත සඳහන් කොන්දේසිවලට යටත් ව, මින් පවරා දෙනු ලැබේ.

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කළ හැකි උපදෙස් අනුව එම බලතල ක්‍රියාවේ යෙදවිය යුතු ය.

(ආ) මේ ආඥාව යටතේ පවරනු ලැබූ බලතල අනුව එවැනි නිලධාරියකු විසින් කරනු ලැබූ තීරණය පිළිබඳ ව සෑහීමට පත් නොවූ යම් කෙනකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ආයාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) නිලධාරියකුට පවරනු ලැබූ දඬුවම් දීමේ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාවේ යෙදවිය යුතු යයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එම බලතල ඒ නිලධාරියා විසින් එම අවස්ථාවේ දී ක්‍රියාවේ යෙදවීම නොකළ යුතු ය

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනය කිරීම සඳහා 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 61 වැනි වගන්තියෙන් පැවරුනු. අයිතිවාසිකම හීන කිරීමක් හෝ ඒ අයිතිවාසිකම කෙරෙහි අන්ලෙසකින් බලපෑමක් හෝ මේ ආඥාවෙහි සඳහන් කිසිවකින් සිදුවේකැයි නොසැලකිය යුතුය. නැතහොත් එලෙස තේරුම් නොගත යුතුය.

3. 1958 අගෝස්තු මස 1 වැනි දින අංක 11,465 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඉක්බිතිව සංශෝධිත 112 දරන ආඥාවෙහි උපලේඛනය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වූ කරුණු අකහැරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### උපලේඛනය

**I තීරුව**

II වැනි ශ්‍රෙණියේ මිනින්දෝරුවෝ
II වැනි ශ්‍රෙණියේ ඡායා සිතියම් ශිල්පී කාර්මිකයෝ
II වැනි ශ්‍රෙණියේ කාර්මික සම්පත් සමීක්ෂණ සහකාරවරු
II වැනි ශ්‍රෙණියේ ගුවන් ඡායාරූප ශිල්පීහු සහ පර්යේෂණාගාර කාර්මිකයෝ
II වැනි ශ්‍රෙණියේ සැලසුම්කරුවෝ
II වැනි ශ්‍රෙණියේ විශෙෂඥ සැලසුම්කරුවෝ
ආධුනික සැලසුම්කරුවෝ
සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ II වැනි ශ්‍රෙණියේ හා සාමාන්‍ය ලිපිකරු පංතියේ නිලධාරීහු
ලඝු ලේඛකයෝ
යතුරු ලේඛකයෝ
පරිවර්තකයෝ
II වැනි හා III වැනි ශ්‍රෙණියේ සරප්වරු
කැටයම් රේඛකයෝ
ගබඩා භාරකරුවෝ
කාර්යාල කාර්ය සහායකයෝ
ආර්ට්පයිසර්වරු
කාර්මිකයෝ
ප්‍රධාන වඩු බාස්වරු
වඩු බාස්වරු
කුඩාරම් අළුත්වැඩියා කරන්නෝ
සිතියම් සවිකරන්නෝ

**II තීරුව**

නියෝජ්‍ය සර්වේ ජනරාල්, සහකාර සර්වේ ජනරාල්, පාලන නිලධාරි

| I වැනි තීරය | II වැනි තීරය |
| --- | --- |
| පොත් බඳින්නෝ<br>චිත්‍රකරුවෝ<br>ආදර්ශ රූප ශිල්පීහු<br>ඡායාරූප සහකාරවරු<br>සහකාර ගබඩාකරුවෝ<br>සයිකල් ඕඩර්ලිවරු<br>ප්‍රධාන කාර්යාලයේ කණිෂ්ඨ සේවකයෝ<br>රියැදුරෝ<br>ලිතෝ අංශයේ ෆෝර්මන්<br>ප්‍රොසෙස් අංශයේ ෆෝර්මන්<br>ෂාප්වෝන් හා ටර්නර් කර්මාන්තකරුවෝ<br>ප්‍රොසෙස් කාර්මිකයෝ<br>ප්‍රධාන වර්නයෝජක<br>වර්නයෝජකයෝ<br>ප්‍රධාන ලිතෝ මුද්‍රණ ශිල්පීහු<br>ලිතෝ මුද්‍රණ ශිල්පීන් හා යන්ත්‍ර බලාගන්නෝ<br>සිතියම් මුද්‍රණ අංශයේ කණිෂ්ඨ සේවකයෝ<br>මුරකරුවෝ | නියෝජ්‍ය සර්වෙ ජනරාල්, සහකාර සර්වෙ ජනරාල්, පාලන නිලධාරී |
| ක්ෂෙත්‍ර ගවේශකයෝ ... ... ...<br>1 වැනි ශ්‍රෙණියේ පුහුණු කම්කරුවන් (ක්ෂෙත්‍ර ඕවර්සියර්වරු)<br>ක්ෂෙත්‍ර කම්කරුවෝ | නියෝජ්‍ය සර්වෙ ජනරාල්, සහකාර සර්වෙ ජනරාල්, පාලන නිලධාරී, කොට්ඨාශවල නියුක්ත පිරිස වෙනුවෙන් එම කොට්ඨාශ භාර මැනුම් අධිකාරීහු හෝ සහකාර මැනුම් අධිකාරි, කණ්ඩායම්වල නියුතු පිරිස වෙනුවෙන් ඒ ඒ කණ්ඩායම භාර සහකාර මැනුම් අධිකාරීහු හෝ කණ්ඩායම් භාර නිලධාරීහු |
| බංගලා භාරකරුවෝ ... ... ...<br>දියතලාවෙහි වැසිකිලි කම්කරුවෝ ... | නියෝජ්‍ය සර්වෙ ජනරාල්, සහකාර සර්වෙ ජනරාල්, පාලන නිලධාරී, දියතලාවේ මැනුම් අධිකාරි |
| ප්‍රාදේශීය කාර්යාලවල කණිෂ්ඨ සේවකයෝ ... ... | නියෝජ්‍ය සර්වෙ ජනරාල්, සහකාර සර්වෙ ජනරාල්, පාලන නිලධාරී ප්‍රාදේශීය කාර්යාල භාර සහකාර මැනුම් අධිකාරි |

11—43

---

ඇල්.ඩී—බී 129/47

පී. 3/64

## 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාව

### 61 වැනි වගන්තිය යටතේ ආඥාව

1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවෙහි 61 වැනි වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ආඥාවයි.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1956 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

### අංක 172 දරණ ආඥාව

මෙහි උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි නිශ්චිත බලතල ඒ උප ලේඛනයෙහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිශ්චිත ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරියාට හෝ නිලධාරීන්ට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මෙයින් පවරනු ලැබෙ :—

(1) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල නිකුත් කළ හැකි උපදෙස් අනුව ඒ බලතල ක්‍රියාවේ යෙදවිය යුතුය.

(2) එසේ බලතල පවරනු ලැබූ නිලධාරියකු විසින් මේ ආඥාව යටතේ තමාට පැවරී ඇති යම් බලයක් යටතේ කරන ලද තීරණය ගැන සෑහීමට පත් නොවූ යම් තැනැත්තකු වේ නම් ඔහු විසින්—

(අ) ඒ තීරණය කරන ලද්දේ ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ, ආයුර්වේද මහාරෝගශාලාවේ වෛද්‍ය අධිකාරි, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති, සහකාර කොමසාරිස් හෝ කාර්ය භාර වෛද්‍ය නිලධාරියකු විසින් නම් ආයුර්වේද කොමසාරිස් වෙතද;

(ආ) ඒ තීරණය කරන ලද්දේ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ උප විද්‍යාලයාධිපති විසින් නම්, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති වෙත ද;

(ඇ) ඒ තීරණය කරන ලද්දේ, ආයුර්වේද මහාරෝගශාලාවේ ආරෝග්‍යශාලා ලේකම්, නේවාසික වෛද්‍ය නිලධාරී, ඖෂධාගාර පරිපාලක, යන නිලධාරීන් ගෙන් කෙනෙකු විසින් නම්, ආයුර්වේද මහාරෝගශාලාවේ වෛද්‍ය අධිකාරි වෙතද;

(ඈ) ඒ තීරණය කරන ලද්දේ, ආයුර්වේද මහාරෝගශාලාවේ ආරෝගශාලා ලේකම්, නේවාසික වෛද්‍ය නිලධාරී, හෝ ඖෂධාගාර පරිපාලක විසින් නම්, සහකාර කොමසාරිස් වෙත ද, ආයාචනා කළ හැකිය.

(3) මේ ආඥාව යටතේ දඬුවම් දීම සම්බන්ධයෙන් යම් නිලධාරියකුට පවරා ඇති බලතල කිසිවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පාවිච්චි කළ යුතුයයි ඒ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් අවස්ථාවකදී ඒ නිලධාරියා ඒ කරුණ සම්බන්ධයෙන් ස්වකීය බලතල ක්‍රියාවේ නො යෙදවිය යුතුය.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආයාචනා කිරීම සඳහා 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 61 වැනි වගන්තියෙන් පැවරුනු අයිතිවාසිකම ඡින කිරීමක් හෝ ඒ අයිතිවාසිකම කෙරෙහි අන් ලෙසකින් බලපෑමක් හෝ මේ ආඥාවෙහි සඳහන් කිසිවකින් සිදුවෙතැයි නොසැලකිය යුතුය. නැතහොත් එලෙස තේරුම් නොගත යුතුය.

3. 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවෙහි 61 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1955 ඔක්තෝබර් මස 7 වැනි දින හා අංක 10,847 දරන ගැසට් පත්‍රයෙහි පළ වූ අංක 83 දරන ආඥාවෙහි කුමක් සඳහන් වුවද මේ ආඥාව බල පැවැත්විය යුතුය.

4. 1958 අගෝස්තු මස 1 වැනි දින අංක 11,465 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඉක්බිතිව සංශෝධිත අංක 112 දරන ආඥාවෙහි උපලේඛනය, ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වූ කරුණු අතහැරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## උපලේඛනය

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ආරම්භක වාර්ෂික වැටුප් රුපියල් 750 ට වැඩි නොවූ ද, තම තමන්ගේ පරිපාලන බලය යටතේ පවත්නාවූද තනතුරු සඳහා (තාවකාලික හෝ අනියම් වූවද) පත්වීම් දීමේ බලය. | ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ, ආයුර්වේද මහාරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති, කායචි භාර වෛද්‍ය නිලධාරීහු, සහකාර කොමසාරිස්. |
| 2. වාර්ෂික වැටුප් රුපියල් 750ට වැඩි නොවූද තම තමන්ගේ පරිපාලන බලය යටතේ පවත්නාවූද නිලධාරීන්ගේ වැඩ තහනම් කිරීමේ බලය. | ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ, ආයුර්වේද මහාරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති, කායචි භාර වෛද්‍ය නිලධාරීහු, සහකාර කොමසාරිස්. |
| 3. විශ්‍රාම වැටුප් සහිත වාර්ෂික පඩිනඩි රුපියල් 2,700 ට වැඩි නොවූ, නැතහොත් විශ්‍රාම වැටුප් රහිත වාර්ෂික පඩිනඩි රුපියල් 3,180 ට වැඩි නොවූද, තම තමන්ගේ පරිපාලන බලය යටතේ සිටින්නාවූද, (ඒකාබද්ධ සේවයන්ට අයත් නිලධාරීන්ගෙන් අන්‍ය වූ) අධිකරණයෙන් වරදකරුවන් වීමේ හේතුව හැර අන්කිසි හේතුවක් උඩ තරවටු කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ සතියක වැටුපට නොවැඩි දඩයක් පැනවීමේ, වැටුප් වැඩිවීම් අවුරුද්දකට නොවැඩි කාලයකට තාවකාලිකව නතර කිරීමේ, නැවැත්වීමේ, අඩු කිරීමේ නැතහොත් පමා කිරීමේ බලය. | ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ, ආයුර්වේද මහාරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යාලයාධිපති, සහකාර කොමසාරිස්, කායචි භාර වෛද්‍ය නිලධාරී. |
| 4. තමන්ගේ පරිපාලන බලය යටතේ සිටින්නාවූද, මෙහි පහත සඳහන් වන්නාවූද, නිලධාරීන්ට තරවටු කිරීමේ හෝ තදින් තරවටු කිරීමේ හෝ සතියක වැටුපට නොවැඩි දඩයක් පැනවීමේ බලය.<br>දිස්පැන්සර්වරු,<br>ටෙලිෆෝන් ඔපරේටර්,<br>ඕවර්සියර්වරු,<br>ටිකට් ලිපිකරුවෝ<br>උපස්ථායකයෝ,<br>උපස්ථායිකාවෝ<br>රසායනාගාර සේවකයෝ,<br>ඖෂධාගාර උපස්ථායකයෝ,<br>මුරකරුවෝ<br>ඩ්‍රයිවර්වරු,<br>ආරෝග්‍යශාලා අරක්කැමියෝ,<br>වින්නඹුවෝ,<br>කාර්යාල කාර්ය සහායකයෝ,<br>හෙදි ආයාවරු,<br>උද්‍යාන කම්කරුවෝ,<br>ඖෂධාගාර කම්කරුවෝ,<br>ශෝධක කම්කරුවෝ,<br>මැහුම් කාරියෝ,<br>යන්ත්‍ර බලාගන්නෝ,<br>බොයිලේරුකරුවෝ,<br>දෛනික වැටුප් ලබන්නෝ. | ආයුර්වේද මහාරෝග්‍යශාලාවේ නේවාසික වෛද්‍ය නිලධාරී, ආයුර්වේද මහාරෝග්‍යශාලාවේ ආරෝග්‍යශාලා ලේකම්, ඖෂධාගාර පරිපාලක, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර. |

මේ උපලේඛනයෙහි '' ඒකාබද්ධ සේවකයන් '' යනුවෙන් ගණකාධිකාරි සේවා, සාමාන්‍ය ලිපිකරු සේවා, ටයිප්කාර සේවය, ස්ථානමාරු කළ හැකි ලඝු ලේඛක සේවය, සරප් සේවය, නැතහොත් භාෂා පරිවර්තක සේවය අදහස් වේ.

11–44

---

## ලියා පදිංචි කළ ව්‍යාපාරවස්තු හා ඇපපත්‍ර ආඥාපනත

(420 වැනි අධිකාරය වන) ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත්‍ර ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව මුදල් ඇමති, උක්තු බණ්ඩා වන්නිනායක වන මම, 1965 අංක 7 දරණ විසර්ජන පනතින් ණය මාර්ගයෙන් ගැනීමට බලය පවරන ලද රුපියල් හැට දෙකෝටියෙන් මෙහි පහත උපලේඛනයෙහි නියමිත මුදල, එම උපලේඛනයේ සඳහන් ක්‍රමය, නියමයන් හා කොන්දේසි අනුව ලංකාව ඇතුළත ණයට ගැනීමට මේ ආඥාවෙන් නියම කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1965 නොවැම්බර් 5 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

1. ණයට ගතයුතු මුදල රුපියල් තුන්කෝටි පනස් ලක්ෂයක් විය යුතුය. තවද එය සම මිලට නිකුත් කරන අවුරුදු 21/25 ණය මුදලක් වශයෙන් ලබාගත යුතුය.

2. ණය මුදල ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු ඇතිකර, නිකුත් කිරීමෙන් පමණක් ලබාගත යුතුය.

3. ණය මුදල සඳහා ගෙවිය යුතු පොළිය වර්ෂයකට සියයට 4½ක් විය යුතුය.

4. ණය මුදල සඳහා සැම වර්ෂයකම අර්ධ වාර්ෂික පොළිය ගෙවිය යුතු දිනයන් මැයි පහළොස් වැනිද හා නොවැම්බර් පහළොස් වැනිද විය යුතුය.

5. ණය බේරීම් සඳහා පිහිටුවන නිදන් අරමුදලට, වර්ෂයකට සියයට 3 මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. මේ ගෙවීම් 1966 නොවැම්බර් පහළොස් වැනිද ආරම්භ විය යුතුය.

**6. ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන ලද ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිදහස් කිරීමේ දිනය, 1990 නොවැම්බර් පහළොස් වැනිද විය යුතුය.**

එසේ වුවද 1986 නොවැම්බර් දහහතර වන දිනට ඉක්බිතිවූත් හය මසකට නොඅඩු කාලයකට පෙර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයකින් ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැකිවූත් යම් දිනයක, ඒ ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු සම මිළට නිදහස් කිරීමට තෝරා ගැනීමේ බලය රජයට තිබිය යුතුය.

## කාර්ය විස්තර පත

ව්‍යාපාර වස්තූන් සඳහා මුදල් භාර ගැනීමේ ලැයිස්තුව 1965 නොවැම්බර් 15 වැනි දින විවෘත කොට 1965 දෙසැම්බර් 15 වැනි දින වසා දමනු ලැබේ. මුළු ණය මුදල ඊට පළමු ව ලබා ගතහොත්, එම ලබාගත් දිනයෙහි ම මුදල් ලැයිස්තුව වසා දමනු ලැබේ.

**ලබා ගන්නා ණය ප්‍රමාණය රුපියල් 3,50,00,000 කි**

## ලංකාණ්ඩුවේ සියයට 4½, 1986–90 ''ඌ'' කාණ්ඩයේ ණය මුදල

**සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවනු ලැබේ.**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාණ්ඩුව වෙනුවෙන් රුපියල් 3,50,00,000ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. එයට ගෙවනු ලබන පොළී ප්‍රමාණය සියයට 4½කි. ණය මුදල ආපසු ගෙවනු ලබන්නේ 1990 නොවැම්බර් 15 වැනිද ය. නමුත්, හය මාසයක් කලින් දැනුම් දීමෙන් 1986 නොවැම්බර් 14 වැනිදට පසුව ඕනෑම දිනයක ණය මුදල ආපසු ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ. ණය ආපසු ගෙවන්නේ ද සම මිලටම ය.

**ණය ලබා ගැනීමේ බලය.**—ණය මුදල ලබා ගන්නේ 1965 අංක 7 දරණ විසර්ජන පනතින් ලත් බලයෙන් හා ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත් ආඥා පනතේ (420 වැනි පරිච්ඡේදය) අඩංගු නීති යටතේ ය.

**අරමුණ.**—රජය විසින් මේ ණය මුදල ලබාගනුයේ 1965 අංක 7 දරණ විසර්ජන පනතේ 2 (1) (බී) වගන්තිය යටතේ 1965–66 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා වැය කරණු පිණිසය.

**නිකුත් කරන පිළිවෙළ.**—ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකිය.)

**ණය කොටසක මිල.**—ණය කොටසක මිල රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල ඉල්ලුම් පත් ඉදිරිපත් කරන විට ගෙවිය යුතුය. අඩුම කොටස රුපියල් සියයකි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් 1965 නොවැම්බර් 15 වැනිද සිට ණය මුදල් ලබා ගන්නා ලැයිස්තුව පියවනතුරු, රාජ්‍ය ණය ලේඛකාධිකාරී විසින් භාර ගනු ලැබේ. ණයට මුදල් දීමේ ඉල්ලීම් නියමිත ඉල්ලුම් පත්‍රිකාවල එවිය යුතු අතර, ඊට ගෙවිය යුතු මුළු මුදල ඒ සමඟ එවිය යුතුය. ලංකා මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කරන්නන්ට ඒ ආයතන සමග කටයුතු පිළියෙළ කොට ඒවා මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකිය.

බැංකුවලට ද (මුදල් ඉතිරි කිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරි කිරීමේ බැංකුව ඇතුලු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට හා අවසර ලත් තැරැව්කරුවන්ට ද, ඔවුන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට 1/16ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ. හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත්වල භාරගත් ණය මුදල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයේම කොමිස් ගෙවනු ලැබේ.

**ව්‍යාපාර වස්තු සඳහා ගෙවීම.**—'' ලංකාණ්ඩුවේ ණය අරමුදල '' යනුවෙන් හරස් රේඛිත කොට මහ බැංකුව වෙත ගෙවීමට අණ කරන චෙක් පතකින් මුදල් ගෙවිය යුතුය.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම්පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු කොටස් සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව මැයි 15 වැනිද හා නොවැම්බර් 15 වැනිද වසකට සියයට 4½ බැගින් පොළී ගෙවනු ලැබේ. පළමුවෙන් පොළී ගෙවන්නේ 1966 මැයි 15 වැනිද ය. ඒ පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1966 මැයි 14 වැනිද තෙක් ඒ දිනයි ද ඇතුලත් වන කාල සීමාව සඳහා ය.

**අයබදු ගැනීම.**—(i) මුද්දර ගාස්තු :—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේ දී පාවිච්චි කරන සෑම ලියවිල්ලක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් ය.

(ii) ආදයම් බදු :—ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට හැර ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදයම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත් ආදයම් බද්දට යටත්වන ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදයම් බදු සඳහා තමාගේ ආදයම් පෙන්වීමේ දී එම පොළිය ද අඩංගු කළ යුතුය. ලංකාවේ පදිංචි නොවූවන්ට හා ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට පොළී ගෙවීමට පෙර ආදයම් බදු අඩු කර පොළී ගෙවනු ලැබේ. (දනට ආදයම් බදු ප්‍රමාණය, ලංකාවේ පදිංචි නොවූ පුද්ගලයන්ගෙන් සියයට 33⅓ක් ද, ධනය ඒකාබද්ධ වූ හින්දු පවුල්වලින් සියයට 39⅓ක් ද, නිර්නේවාසික සමාගම් වලට ගෙවන ලද හෝ බැර කරන ලද පොළිය සම්බන්ධයෙන් සියයට 67ක් ද වෙයි.) ලංකා ආදයම් බද්දෙන් නිදහස් අයට, අය කරනු ලැබූ ආදයම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

(iii) ධන බද්ද.—ලංකාණ්ඩුවේ සුරැකුම්පත්වල කරන ආයෝජනයන් 1963 අංක 4 දරන දේශීය ආදයම් බදු පනතේ 31 (1) (ඊ) වගන්තිය යටතේ පුද්ගලයෙකුගේ ධනයට ඇතුළත් නො කැරෙන අතර ඒවා ධන බද්දෙන් ද නිදහස් වෙයි.

(iv) බූදල් බද්ද :—ලංකාණ්ඩුව විසින් ලංකාව ඇතුළත නිකුත්කරන ලද ව්‍යාපාර වස්තු, බූදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. සම්පූර්ණ මුදල ගෙවූ සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවන ව්‍යාපාර වස්තූන්ගේ නාමික මිලත්, එයින් රැස්වන පොළියත්, ඒ සමාන බූදල් බද්දක් ගෙවීමට යෙදිය හැක. සම්පූර්ණ මුදල නො ගෙවූ හෝ අඩු මිලට නිකුත් කළ හෝ සම මිලට නොව වෙනයම් මිලකට ආපසු ගෙවන හෝ ව්‍යාපාර වස්තූන් සඳහා රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකිනුත්, එයින් උපදින පොළියෙනුත් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය වරින් වර ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවේ. නමුත් එවැනි රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකින් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය, මුලින් ව්‍යාපාර වස්තුව නිකුත් කරන අවස්ථාවේ දී ගෙවූ මුදලත්, ව්‍යාපාර වස්තුව ආපසු ගෙවීමේ දී ගෙවන මුදලත් යන දෙකින් අඩු මුදල යමක් වේ ද, එයට නො අඩු මුදලක් වේ. මුදලින් බූදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම කළ හැක්කේ එම ව්‍යාපාර වස්තූන් මුලින් නිකුත් කරන අවස්ථාවේ දී ම මියගිය තැනැත්තා විසින් මිලයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නො අඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තූන් මිලයට ගෙන තිබේ නම් හෝ පමණකි.

**සුරක්ෂිතතාවය.**—ණය මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ආරක්ෂා වී ඇත. ණය ගෙවීමේ අරමුදල්හි භාරකරුවන් වන මහ බැංකුවේ මුදල් මණ්ඩලය එහි පාලනය යටතේ ණය මුදල් බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලක් පිහිටුවනු ඇත. වර්ෂයකට සියේට 3 ප්‍රමාණය අනුව 1966 නොවැම්බර් 15 වැනිද සිට නිදන් අරමුදලට අර්ධ වාර්ෂික ගෙවීම් පටන් ගනු ලැබේ.

**ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.**—දනට ලංකාණ්ඩුවේ දළ සදහන ණය ප්‍රමාණය රු. 2,62,95,06,791 කි. ණය බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලේහි ආසන්න වෙළඳ වටිනාකම රු. 41,27,55,736 කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 2,21,67,51,055 කි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන්, වාණිජ බැංකුවලින්, කච්චේරිවලින්, තැපැල් කාර්‍යාලවලින් හෝ ජාතික මුදල් ඉතිරි කිරීමේ ව්‍යාපාරයේ කොමසාරිස්වරයාගේ කාර්‍යාලයෙන් ද ලබා ගත හැකි ය.

ඩී. බී. ගුණවර්ධන,
රාජ්‍ය ණය ලේඛකාධිකාරී.

කොළඹ 1,
තැ.පෙ. 1149,
ශ්‍රී ලංකා මහ බැංකුව,
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
1965 නොවැම්බර් 5 වැනි දින දී ය.

ඇල් ඩී—බී 175 ඒ/29.

## පාසැල් ගුරු විශ්‍රාම වැටුප් පනත

(432 වැනි අධිකාරය වන) පාසැල් ගුරු විශ්‍රාම වැටුප් පනතෙහි 9 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

ආර්. විමලසේන,
වැඩ බලන මුදල් ඇමති.

1965. 10. 12 වැනි දින,
කොළඹ දී ය.

**නියෝගය**

1928 පෙබරවාරි මස 24 වැනි දින හා අංක 7,631 දරන ගැසට් පත්‍රයෙහි ("ව්‍යවස්ථා" යනුවෙන් එහි සඳහන්ව) ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කළ සංශෝධනය කරනු ලැබූ පාසල් ගුරු විශ්‍රාම වැටුප් නියෝග, ඒ නියෝගවල 10 වැනි නියෝගය අගට පහත දැක්වෙන එකතු කිරීම මගින්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" එසේ වුවත්, එබඳු ගුරුවරයෙකුගෙන් ආණ්ඩුවට හෝ ලෝහෝර් ආර්යා අරමුදලට හෝ අයවිය යුතු මුදල් ප්‍රමාණය හෝ ප්‍රමාණයන් එසේ ගෙවිය යුතු මුදලින් අයකර ගත යුතුය. "

11-8

---

## බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත

(318 වැනි අධිකාරය වන) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 6 (1) දරන වගන්තියේ විධිවිධාන අනුව යථෝක්ත ආඥාපනතේ 5 වැනි වගන්තියෙහි සඳහන් වන උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සුනිල් ඇස්. අබේසුන්දර මහතා මෙහි පහත සඳහන් දින සිට වර්ෂ පහක කාලසීමාවක් සඳහා ගරු අධිකරණ ඇමතිතුමා විසින් පත්කොට ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

වර්ෂ 1965 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

11-183

---

## පත්වීම් අවලංගු කිරීම

අංක : ඒජේ. 14/3/61.

නාගකන්කානම්ගේ පීටර් ද සිල්වා මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් පත් කරමින් මෙම ගැසට් පත්‍රයේ පළකර ඇති දැන්වීම නිසා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරු වශයෙන් ඔහු පත් කර මින් 1965 සැප්තැම්බර් 3 වැනි දින අංක 14,495 දරන ගැසට් පත්‍රයේ පළවී ඇති දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965.11.1 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-223

---

## දැන්වීමයි

කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නෝතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ඩබ්දේව ජයසිංහ මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දීය.

11-10

ඇල්.ඩී.—බී. 89/35.

## ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත

(463 වැනි අධිකාරය වන) ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 6 (2) (අ) වගන්තිය යටතේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාව.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

1965 ඔක්තෝබර් 27,
කොළඹ දී ය.

**ව්‍යවස්ථාව**

1935 ජූලි 19 වැනි දින අංක 8,134 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ව්‍යවස්ථාවෙන් සංශෝධිත, 1935 ජූනි 21 වැනි දින අංක 8,130 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ, ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ 6(2) (අ) වගන්තිය යටතේ පනවනු ලැබූ ව්‍යවස්ථා, ඒ ව්‍යවස්ථාවල 3 වැනි ව්‍යවස්ථාවෙහි "දිය යුතුය" යන වචන වෙනුවට "දිය හැකි ය" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

11-40

---

## ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලය

ගරු කම්කරු, රැකිරක්ෂා හා නිවාස ඇමතිතුමා විසින් (132 වන පරිච්ඡේදය) ඉන්දියානු ආගාමික කම්කරු ආඥාපනතේ 9 (1) වන වගන්තිය යටතේ 1965.11.1 වන දින සිට තුන් වර්ෂයක කාල සීමාවක් ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සේවය කිරීම සඳහා සාමදාන විනිශ්චයකරු කෘතිගේසු නාඩේසන් මහතා, එම්.බී.ඊ., පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඩ. වීරසිංහ,
ස්ථිර ලේකම්.
කම්කරු, රැකිරක්ෂා හා නිවාස අමාත්‍යාංශය.

1965 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දීය.

11-105

---

## පඩිපාලක සභා ආඥාපනත

**නිවේදනයයි**

තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් වශයෙන් 1965 මැයි මස 17 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ සේවය කිරීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු, රැකිරක්ෂා හා නිවාස ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඩ. වීරසිංහ,
කම්කරු, රැකිරක්ෂා හා නිවාස අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1965 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දීය.

**නාම නියම කොට පත්කරන ලද සාමාජිකයෝ :**

1. ඇස්. ඒ. විජයතිලක මහතා
2. දොස්තර ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා
3. සාමදාන විනිශ්චයකාර තැන්පත් දොස්තර ඒ. පර්සි කුරුප්පු මහතා

**සේව්‍ය නියෝජිතයෝ :**

1. ඇස්. කේ. ඩී. ජයමාන්න මහතා
2. සී. රාජසූරිය මහතා
3. කේ. ජේ. රත්වත්තෙ මහතා
4. ඒ. සෙන්ට් වී. -වීරරත්න මහතා
5. වී. ජී. ඩබ්ලිව්. රත්නායක මහතා
6. ජේ. ඩබ්ලිව්. ක්‍රේග් මහතා
7. ජේ. එල්. සී. පීරිස් මහතා
8. උපාලි ඩයස් මහතා
9. ඇම්. පී. අමරසූරිය මහතා
10. බී. වරුෂවිතාරණ මහතා
11. ඇස්. ඇස්. පෙරේරා මහතා
12. ඇම්. ඇස්. ප්‍රනාන්දු මහතා

සේවක නියෝජිතයෝ :

1. පාර්ලිමේන්තු මන්ත්‍රී, වී. අන්නමලේ මහතා
2. ඇස්. ඇම්. සුබ්බයියා මහතා
3. වී. පෙරියන් මහතා
4. ඒ. අසීස් මහතා
5. ඇම්. ඒ. තංගවේල් මහතා
6. ජේ. වනිගතුංග මහතා
7. පී. සින්නයියා මහතා
8. ඇන්. ෂන්මුගදාසන් මහතා
9. ආර්ලිස් කහවිතාරණ මහතා
10. තිලක කුලසේකර මහතා
11. ඇස්. කාරියපෙරුමාල් මහතා
12. ඇම්. විල්බට් ද සිල්වා මහතා

11-170

---

අංකය : ඔබලිව. 105/632.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කොළඹ 10, ජයන්ති වීරසේකර මාවතේ අංක 47 හි ලංකා වතු කම්කරු සමිතිය, හා පාදුක්කේ හේවාගම වත්තේ වතුපාලක අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද :

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතී තැන්පත් මොහමඩ් හනීෆා මොහමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, බේරුම්කරුවා වශයෙන් කොළඹ 10, මාලිගාකන්ද පාරේ අංක 184 හි ඇම්. ආර්. ඒ. කරීම් මහතා පත්කර එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා මෙයින් ඔහු වෙත යොමු කරමි.

එම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතී.

1965 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

68-69/65

## කාර්මික ආරාවුල් පනත—131 වන පරිච්ඡෙදය

ලංකා වතු කම්කරු සමිතිය, 47, ජයන්ත වීරසේකර මාවත කොළඹ 10

සහ

වතුපාලක, හේවාගම වත්ත, පාදුක්ක

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ලංකා වතු කම්කරු සමිතිය සහ පාදුක්කේ හේවාගම වත්තේ වතු පාලක අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ, යථෝක්ත සමිතියේ පහත සඳහන් ඉල්ලීමය :—

(1) කර්මාන්තශාලාවේ වැඩ වලින් ඉවත් කරනු ලැබූ කම්කරුවන් 7 දෙනාට නැවත කර්මාන්තශාලාවේ වැඩ දීම.

(2) එස්. ගිරිගෝරිස්, චන්ද්‍රා සහ ආර්. කදිරේෂන් යන මහතුන්ට නැවත රැකියාව දීම.

(3) කිරි කට්ටි දීමට ප්‍රතික්ෂේප කළ රබර් කපන්නන් 96 දෙනාට ආපසු ඔවුන්ගේ කිරි කට්ටි දීම.

1965 ඔක්තෝබර් මස 13 දා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දිනා යොදන ලදී.

ආර්. ඇල්. ගුණසේකර,
වැඩබලන කම්කරු කොමසාරිස්.

11—20

---

## නිවේදනයයි

පහත දැක්වෙන කටයුතු කිරීමට රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ ඇමති තුමා විසින් මා පත්කර ඇති බව සියළු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි. ඒ කටයුතු නම්—

(I) (මෙහි මින් මතු "රජයේ වැලිපෝන් සේවය" සහ "වැලිපෝන් පණිවුඩ" යනුවෙන් පිළිවෙළින් සඳහන් කරනු ලබන) ලංකාවේ වැලිපෝන් පණිවුඩ හුවමාරු කිරීම සඳහා රජය විසින් පිහිටුවනු ලැබ. පවත්වාගෙන යනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන සේවයෙන් හෝ ඒ මඟින් යවනු ලැබූ හෝ සම්ප්‍රේෂණය කරනු ලැබූ පණිවුඩ 1960 ජනවාරි 1 දින ආරම්භව, 1965 සැප්තැම්බර් 30 වන දින අවසන්වන කාලසීමාව තුළ නීතිවිරෝධි බාධාකිරීම්වලට යටත් කරන ලද්දේ ද නැතිද යනවිග පරීක්ෂාකොට වාර්තා කිරීම සහ එසේ නම්,

(අ) එසේ නීති විරෝධී ලෙස බාධා කිරීම සාර්ථක කර ගනු ලැබූ මාර්ග හෝ උපක්‍රම සහ විශේෂයෙන්, රජයේ වැලිපෝන් සේවය සලස්වා දීම සඳහා පාවිච්චි කරනු ලැබූ උපකරණ හෝ ස්ථාන, එසේ නීති විරෝධී බාධා කිරීම සාර්ථක කර ගැනීමේ කාර්යය සඳහා අයුතු ලෙස උපයෝගි කර ගනු ලැබූ ප්‍රමාණය ;

(ආ) ස්වකීය පෞද්ගලික සේවයන් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ හැරීමෙන් හෝ අන් කවර ලෙසකින් වුව ද විදුලි සන්දේශ නිලධාරීන්, වෙනත් රජයේ නිලධාරීන් හෝ මහජනයා විසින්, සහාය දීමෙන්, නිසොල්මන්ව ඉඩ හැරීමෙන් හෝ සහයෝගය දැක්වීමෙන් එසේ නීති විරෝධී බාධා කිරීම කෙනෙක් දුරට සාර්ථක කර ගනු ලැබූයේ ද යන විග හා ඒ නිලධාරීන්ගේ හෝ පුද්ගලයන්ගේ නම් ; සහ

(ඇ) එසේ යම් තැනැත්තන් විසින් නීති විරෝධී බාධා කිරීම්වලට යටත් කරන ලද වැලිපෝන් පණිවුඩවල අඩංගු කරුණු ඔවුන් විසින් වෙනත් තැනැත්තන් හට එළිදරවු කරන ලද ප්‍රමාණය, සහ ඒ කරුණු එසේ යම් තැනැත්තන් විසින් එළිදරවු කරන ලද්දේ ද ඒ තැනැත්තන්ගේ නම් සහ ඒ කරුණු එසේ යම් තැනැත්තන්හට එළිදරවු කරන ලද්දේ ඒ තැනැත්තන්ගේ නම් ; සහ

(II) මහජන ශුභ සිද්ධිය තකා ඒ පණිවුඩවල අඩංගු කරුණු පිළිබඳ රහස්‍යතාව ආරක්ෂා කිරීමේ යෝග්‍යත්වය ගැන ද, විශේෂ වශයෙන්, (වැලිපෝන් පණිවුඩවලට නීතිවිරෝධී බාධා කිරීම සහ ඒ පණිවුඩවල අඩංගු කරුණු එළිදරවු කිරීමත් සම්බන්ධයෙන් විදුලි සන්දේශ නිලධාරීන් විසින් හෝ වෙනත් රජයේ නිලධාරීන් විසින් හෝ මහජනයා විසින් සිදු කරනු ලබන වැරදි සඳහා වඩා නිවර්තක දඬුවම් සලස්වා දීම ඇතුළුව) රජයේ වැලිපෝන් සේවයට අදාළ වන නීතිය, ව්‍යවහාරය හා කාර්යපරිපාටිය ගැන ද සැලකිලිමත් ව, පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන්, අනාගතයේ දී වැලිපෝන් පණිවුඩ එබඳු නීති විරෝධී බාධා කිරීම්වලට යටත් කිරීම වැලැක්වීම සඳහා ඔබ විසින් අවශ්‍ය යයි සලකනු ලබන නිර්දේශයන් කිරීම ද වේ.

2. තවද,

(අ) තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ විදුලි සංදේශ අංශයෙහි කලින් සිටි හෝ දැනට සිටින හෝ යම් නිලධාරියෙකුට හෝ සේවකයෙකුට හෝ ; සහ

(ආ) විසැඳිය යුතු කරුණුවලට අදළ වන කවර කරුණක් හෝ සම්බන්ධයෙන් කරුණු සැලකරන මහජනයාගෙන් කවර හෝ කෙනෙකුට හෝ එබඳු කරුණු කරුණු සැලකිරීම් ලියවිල්ලක මාර්ගයෙන් පහත සඳහන් ලිපිනයට වශ 1965ක්වූ නොවැම්බර් 20 වැනි දිනට මත්තෙන් මා වෙත ඇනුම් දෙන ලෙසත්,

මෙයින් ආරාධනය කර සිටිමි.

3. මා වෙත ලැබෙන සියළුම කරුණු සැලකිරීම් රහස්‍ය ලෙස සලකනු ලැබේ. විසඳිය යුතු කරුණුවලට අදාළ හැටියට මට පෙනියන කවර කරුණක් සම්බන්ධයෙන් තමන් විසින් කරන ලද කරුණු සැලකිරීම් පිළිබඳව මා ඉදිරිපිටට පැමිණ, සාක්ෂිකරුවකු වශයෙන් කට වචනයෙන් විභාග කරනු ලැබීමට කවර පුද්ගලයකුගෙන් වුව ඉල්ලා සිටිය හැකි ය.

4. සාක්ෂි සටහන් කර ගැනීම සඳහා රැස්වීම් වාර මා අරඹන දිනය පසුව ඇනුම් දෙනු ලැබේ.

ජී. පී. තම්බයියා,
ස්ථිර ලේකම්,
රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

65. 11. 1.
11-231

අංකය : ඩබ්ලිව්. 105/76.

## ංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස් ්රයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව කොළඹ 3, ගාලු පාරේ 562/10 දරන ස්ථානයේ ලංකා කම්කරු සංගමය හ නාවලපිටියේ ගුරුක්ඔය වත්තේ වතු පාලක අතර කාර්මික ාරාවුලක් පවතින හෙයින්ද :

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති තැන්පත් මොහොමඩ් නිf්පා මොහොමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා )62 අංක 4 දරන පනත්වලින් සංශෝධිතවූ, ලංකාවේ ව්‍යවස්ථාපිත ණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන ාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ති බලතල අනුව, බේරුම්කරුවා වශයෙන් රාජගිරියේ, නාවල, කාස්වත්ත පාරේ අංක 15/1 හි ජේ. ඕ. ද සා. බණ්ඩාරනායක මහතා, ත්කර එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම දහා මෙයින් ඔහු වෙත යොමු කරමි.

එම්. එච්. මොහොමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

)65 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දීය.

### කාර්මික ආරාවුල් පනත—131 වන පරිච්ඡේදය

ලංකා කම්කරු සංගමය,
562/10, ගාලු පාර, කොළඹ 3
සහ
වතුපාලක, ගුරුක්ඔය වත්ත,
නාවලපිටිය

තර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ලංකා කම්කරු සංගමය සහ නාවලපිටියේ ගුරුක්ඔය වත්තේ තුපාලක අතර ආරාවුලට හේතු වී පවත්නේ පහත සඳහන් කරුණුය :—

(i) 1965 අගෝස්තු මස 7 වන දින දරන ලිපියෙන් ගුරුක්ඔය වත්තේ වතුපාලක විසින්, නාවලපිටියේ ලංකා කම්කරු සංගමයේ දිස්ත්‍රික් නියෝජිත වෙත කරන ලද තහනම යුක්ති සහගතද යන්න.

(ii) (1) එන්. වඩිවේල්, (2) රාජ ලෙච්චුමි, (3) ආර්. සිවන්නු, (4) සිවනුගේ පුත්‍ර, එස් පාප්පු, (5) සිවනුගේ පුත්‍ර, දොරෙයි සාමි, (6) සිවනුගේ පුත්‍ර, පලනියන්ඩි යන අයව සේව යෙන් පහකිරීම යුක්ති සහගතද යන්න හා ඔවුන් එකි නෙකාට හිමිවිය යුතු සහනය කවරේද යන්න.

(iii) 1965.7.1 වන දින සිට, මාසයක කාලපරිච්ඡේදයකට, කේ. වේම්බඩිගේ වැඩ තාවකාලිකව නතරකිරීම යුක්ති සහගතද යන්න හා ඔහුට හිමිවිය යුතු සහනය කවරේද යන්න.

(iv) වේලයම්මාල්, වේලායුධන්ගේ පුත්‍ර මූකයියා, නායගම්ගේ පුත්‍ර ඇන්තනි, ගුරුසාමි, අනසිකුට්ටිගේ වැන්දඹු බිරිය වන තෙයිවානි යන අයට රැකියාව නොදීම යුක්ති සහගතද යන්න හා ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනය කවරේද යන්න.

(v) වතුපාලක තැන්පත් ජේ. මෙඩ් මහතා, පී. ක්‍රිෂ්ණන්ට පහර දුන්නේය යන චෝදනාව සත්‍යයක්ද යන්න හා එය එසේ නම් ක්‍රිෂ්ණන්ට හිමිවිය යුතු සහනය කවරේද යන්න.

(vi) නල්ලතම්බි, පලනිසාමි සහ සුප්පයියාගේ පුත්‍ර ආරුමූගම්ට සතිපතා සලාකය දීම ප්‍රතික්ෂේප කිරීම යුක්තිසහගතද යන්න හා ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනය කවරේද යන්න.

(vii) වැඩ වර්ජනය පැවති කාලයේදී, තේ, උම්බලකඩ, පරිප්පු සහ වෙනත් ආහාර ද්‍රව්‍යය වැඩ වර්ජනය කර සිටි කම්කරුවන්ට දීම ප්‍රතික්ෂේප කිරීම යුක්තිසහගතද යන්න හා මේ සම්බන්ධයෙන් එක් එක් කම්කරුවාට හිමිවිය යුතු සහනය කවරේද යන්නය.

1965 ඔක්තෝබර් මස 21 දාවූ මෙදින කොළඹ, කම්කරු කොම සාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. එල්. ගුණවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.



අංකය : ඊ 23/කො. 376/65.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පක්ෂයක් වශයෙන් සීමාසහිත (ලංකා) මැකලම් බෲවරීස් හි හිටපු සේවකයින් වන කොළඹ 8, කිතුල්වත්ත පටුමගේ අංක 80/1 හි ඩී. එස්. වෛද්‍යවංශ, කේ. චන්ද්‍රදාස, ජී. ස්ටිවන් පෙරේරා, එච්. ආර්. පෙරේරා, ඩබ්ලිව්. රත්නායක, ඔලිවර් නානායක්කාර, ටී. ඒ. අමරසේකර සහ ඩබ්ලිව්. සේනානායක යන මහතුන් සහ අනික් පක්ෂය වශයෙන් කොළඹ 11 නොරිස් පාරේ අංක 77 හි සීමාසහිත (ලංකා) මැකලම් බෲවරීස් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද :

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති තැන්පත් මොහොමඩ් හනීපා මොහමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, බේරුම්කරුව වශයෙන් නුවරඑළියේ, ක්වීන් එලිසබත් ඩ්‍රයිව් "ක්ලිෆ්ටන්" හි එෆ්. ටී. අලස් මහතා පත්කර එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා මෙයින් ඔහු වෙත යොමු කරමි.

එම්. එච්. මොහොමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දීය.

### කාර්මික ආරාවුල් පනත—131 වන පරිච්ඡේදය

එක් පක්ෂයක් වශයෙන්, සීමාසහිත (ලංකා) මැකලම් බෲවරීස් හි හිටපු සේවකයින් වන, කොළඹ 8, කිතුල්වත්ත පටුමගේ, අංක 80/1 හි ඩී. එස්. වෛද්‍යවංශ මහතා, කේ. චන්ද්‍රදාස මහතා, ජී. ස්ටිවන් පෙරේරා මහතා, එච්. ආර්. පෙරේරා මහතා, ඩබ්ලිව්. රත්නායක මහතා, ඔලිවර් නානායක්කාර මහතා, ටී. ඒ. අමරසේකර මහතා සහ ඩබ්ලිව්. සේනානායක මහතා

සහ

අනික් පක්ෂය වශයෙන් කොළඹ 11, නොරිස් පාරේ, අංක 77 හි සීමාසහිත (ලංකා) මැකලම් බෲවරීස් අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

එක් පක්ෂයක් වශයෙන් සීමාසහිත (ලංකා) මැකලම් බෲවරීස් හි හිටපු සේවකයන් වන, ඩී. එස්. වෛද්‍යවංශ, කේ. චන්ද්‍රදාස, ජී. ස්ටිවන් පෙරේරා, එච්. ආර්. පෙරේරා, ඩබ්ලිව්. රත්නායක, ඔලිවර් නානායක්කාර, ටී. ඒ. අමරසේකර සහ ඩබ්ලිව්. සේනානායක යන මහතුන් සහ අනික් පක්ෂය වශයෙන් සීමාසහිත (ලංකා) මැකලම් බෲවරීස් අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ :

ඩී. එස්. වෛද්‍යවංශ මහතා, කේ. චන්ද්‍රදාස මහතා, ජී. ස්ටිවන් පෙරේරා මහතා, එච්. ආර්. පෙරේරා මහතා, ඩබ්ලිව්. රත්නායක මහතා, ඔලිවර් නානායක්කාර මහතා, ටී. ඒ. අමරසේකර මහතා සහ ඩබ්ලිව්. සේනානායක මහතා යන සීමාසහිත (ලංකා) මැකලම් බෲවරීස් හි හිටපු සේවකයින් රැකියාවෙහි නොයොදා සිටීම යුක්ති සහගතද යන්න හා ඔවුන් එක් එක්කෙනාට කවර සහනයක් හිමි විය යුතුද යන්නය.

1965 සැප්තැම්බර් මස 30 දා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස් කාර්යාලයේදී දින යොදන ලදී.

එන්. එල්. අබේවීර,
කම්කරු කොමසාරිස්.

අංකය : ව23/කො. 36/65.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පක්ෂයක් වශයෙන් මහරගම, "ස්වීනිතා" හි පී. ඇන්. සී. පෙරියප්පෙරුම මහතා බාරේ පී. ඇන්. සී. පෙරියප්පෙරුම, පී. ඩී. පී. ද මෙල්, එල්. අයි. එම්. ජේපල්සිංගර්, ඒ. එච්. ගුණරත්න, පී. ආර්. සුධාකරන්, එච්. එම්. චාර්ලිස්, කේ. ජී. සිරිපාල, හා එස්. සිවරත්නම් යන සීමාසහිත ලුවිස් බ්‍රවුන් සහ සමාගමේ හිටපු සේවක මහතුන් සහ අනික් පක්ෂය වශයෙන් කොළඹ මැකලම් පාරේ සීමාසහිත ලුවිස් බ්‍රවුන් සහ සමාගම අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද :

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති තැන්පත් මොහොමඩ් හනීෆා මොහොමඩ් වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, බේරුම්කරුවා වශයෙන් කොළඹ 10, හාමර් පෙදෙසේ අංක 10 යි පී. දේවරාජන් මහතා පත්කර එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා මෙයින් ඔහු වෙත යොමු කරමි.

එම්. එච්. මොහොමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ දීය.

### කාර්මික ආරාවුල් පනත—131 වන පරිච්ඡේදය

එක් පක්ෂයක් වශයෙන් මහරගම, "ස්වීනිතා" හි පී. ඇන්. සී. පෙරියප්පෙරුම මහතා බාරේ, පී. ඇන්. සී. පෙරියප්පෙරුම, පී. ඩී. පී. ද මෙල්, එල්. අයි. එම්. ජේපල්සිංගර්, ඒ. එම්. ගුණරත්න, පී. ආර්. සුධාකරන්, එච්. එම්. චාර්ලිස්, කේ. ජී. සිරිපාල සහ එස්. සිවරත්නම් යන සීමාසහිත ලුවිස් බ්‍රවුන් සහ සමාගමේ හිටපු සේවක මහතුන්

සහ

අනික් පක්ෂය වශයෙන් කොළඹ, මැකලම් පාරේ
සීමාසහිත ලුවිස් බ්‍රවුන් සහ සමාගම
අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

එක් පක්ෂයක් වශයෙන් මහරගම, "ස්වීනීතා" හි පී. ඇන්. සී. පෙරියප්පෙරුම මහතා බාරේ, පී. ඇන්. සී. පෙරියප්පෙරුම, පී. ඩී. පී. ද මෙල්, එල්. අයි. එම්. ජේපල්සිංගර්, ඒ. එච්. ගුණරත්න, පී. ආර්. සුධාකරන්, එච්. එම්. චාර්ලිස්, කේ. ජී. සිරිපාල සහ එස්. සිවරත්නම් යන සීමාසහිත ලුවිස් බ්‍රවුන් සහ සමාගමේ හිටපු සේවක මහතුන් සහ අනික් පක්ෂය වශයෙන් කොළඹ, මැකලම් පාරේ සීමාසහිත ලුවිස් බ්‍රවුන් සහ සමාගම අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ : පී. ඇන්. සී. පෙරියප්පෙරුම, පී. ඩී. පී. ද මෙල්, එල්. අයි. එම්. ජේපල්සිංගර්, ඒ. එම්. ගුණරත්න, පී. ආර්. සුධාකරන්, එච්. එම්. චාර්ලිස්, කේ. ජී. සිරිපාල සහ එස්. සිවරත්නම් යන මහතුන් සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්න හා ඔවුන් එක් එක් කෙනාට කවර සහනයක් හිමිවිය යුතු ද යන්නය.

1965 ඔක්තෝබර් මස 21 ද වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
වැඩබලන කම්කරු කොමසාරිස්.

11-104

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීපා මොහමඩ් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965 ඔක්තෝබර් 18 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ආදායම් නිලධාරි කොට්ඨාශයේ කෝට්ටේ නගර සභා සීමාව ඇතුලත, වැලිකඩ අංක 514 දරණ ග්‍රාමසේවක වසමේ පිහිටි වලව්වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 11ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : මැල්කම් පෙරේරා, කාල් කීර්තිසිංහ, එම්. එල්. පී. මැන්දිස්, වෛද්‍ය එච්. සී. ගොමස්, එඩ්ගා ගොමස්, පී. ගොමස් සහ අනිකුත් අයට අයිති ඉඩම් ;

නැගෙනහිරට : යූ. එල්. ලිලියට් සිල්වා මහත්මියට, ස්ටිව්න් ගෝමස් මහත්මියට, සී. ආම්. වීරසිංහ, එච්. ආල්. වීරමන් සිල්වා-කාල් ගුණවර්ධන, ජේ. සී. පෙරේරා, එච්. ඊ. ඩී. පෙරේරා සහ අනිකුත් අයට අයිති ඉඩම් සහ රාජගිරිය ප්‍රසිද්ධ පාර :

දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි මුඩු බිම් සහ ඒ. අයි. ඔබේසේකර මහතා දැනට පදිංචි මෙම ඉඩමේ ඉතිරි කොටස.

11-23

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965, ඔක්තෝබර් 18 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරළේ අධිකාරී පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 245 දරණ සූරියපාළුව ග්‍රාම සේවක වසමේ පිහිටි "බෝගහ වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 3ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ජී. ඩී. එෆ්. ආර්. රත්නසේකරට අයත් එම ඉඩමේම කොටසක් ;

දකුණට : ජී. ඩී. එෆ්. ආර් රත්නසේකරට අයත් එම ඉඩමේම කොටස හා ඇස්. සී. ඒමෝනිස් ප්‍රනාන්දුට අයත් ඉඩම ;

නැගෙනහිරට : කෝන්ගහ වත්ත නමැති රජයේ ඉඩම හා ඇස්. කේ. විල්බට් ට අයත් ඉඩම ;

බස්නාහිරට : ජී. ඩී. එෆ්. ආර්. රත්නසේකරට අයත් එම ඉඩමේම කොටස.

11-21

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති මොහොමඩ් හනීෆා මොහොමඩ් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙයි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965 ඔක්තෝබර් 15 දින,
කොළඹ දීය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඒකල ග්‍රාම සේවක වසමේ පිහිටි ස්ට්‍රැන්ටන්වික් වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 11ක පමණ ප්‍රමාණයක ඉඩමේ කොටසක් :—

උතුරට : පුද්ගලික පාර ;
දකුණට : ජාඇල ඇල ;
නැගෙනහිරට : පුද්ගලික පාර ;
බස්නාහිරට : පුද්ගලික පාර.

11-39

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## දැන්වීමයි

### මහ/ඔටරි පාසල, හැටන්—කළමනාකාරත්වය වෙනස්වීම

යථෝක්ත පාසලේ කළමනාකාර ධුරය දැරූ ගරු එස්. එම්. ජේකබ් දෙවගැතිතුමා වෙනුවට ලංකා මෙතෝදිස්ත දේවස්ථානයේ සභාපතිතුමාගේ නිර්දේශය අනුව ගරු ඩබ්ලිව්. ඒ. රත්නවීර දෙවගැතිතුමා 939 ආඥපණතේ 31(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල වලට අනුව ආධාර මුදල් ලැබීමට පමණක් හැකිවන සේ මහ/ඔටරි පාසලේ කළමනාකරු වශයෙන් 1965 ඔක්තෝබර් මාසයේ සිට පත් කරනු ලබන බව මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ.

ජී. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ස.පා.පා.න. 8,
1965 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදිය.

11-169

---

## වන්දනා ගමන් ආඥපනත

### රුහුණු කතරගම දේවාලයේ 1965 ඉල් මස උත්සවය

අංක 14,539 සහ 1965 ඔක්තෝබර් 22 වැනි දින දරන රජයේ ගැසට් පත්‍රයේ පළවූ පරිදි 1965 නොවැම්බර් 7 සිට 9 දක්වා කාලය තුළ පැවැත්වීමට නියමිතව තුබූ ඉහත සඳහන් උත්සවය 1965 දෙසැම්බර් 7 සිට 9 දක්වා කාලය තුළ පැවැත්වීම සඳහා කල් දමා ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කෙරේ.

2. මේ සම්බන්ධයෙන් මහජනයාට යම් හිරිහැරයක් වූයේ නම් ඒ ගැන කණගාටුව ප්‍රකාශ කෙරේ.

ආර්. පී. ඩබ්ලිව්. අබේරත්කර,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1965.10.30,
කච්චේරිය, මොණරාගල.

11-160

---

## දැන්වීමයි

කල්මුනේ අඩවියේ, ලහුගල වන රක්ෂක නිලධාරී ඇස්. ජේ. කේ. මරියනායගම් මහතා විසින් පැමිණිලි කරන ලද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඩී 121 සංඛ්‍යාව දරන මුද්‍ර මිටිය එම නිලධාරියාගේ භාරයෙන් නැතිවී ඇති බව ලංකාණ්ඩුවේ හා මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

යථෝක්ත සංඛ්‍යාව දරන කිසිම දැව මිටියක් හෙලීම, ප්‍රචාරනය කිරීම හෝ මිලදී ගැනීම වන ආඥාපනත යටතේ නීතියෙන් දඬුවම් දිය හැකි වරදක් බව මහජනයාට මෙයින් දන්වා.ද කරනු ලැබේ.

ම. නමසිවායම්,
වැඩ බලන වන සංරක්ෂක.

කැලෑ දෙපාර්තමේන්තුව,
කොළඹ 2.

11-168

---

## රජයේ දැන්වීමයි

### කොළරා—විසාඛපට්නම් වරාය

විසාඛපට්නම් ප්‍රදේශය කොළරා රෝගය පැතිර ඇති ප්‍රදේශයක් බවට ප්‍රකාශ කර තිබෙන බව මෙයින් සියලු දෙනාගේම දැනගැනීම පිණිස ප්‍රකාශ කරමි. එබැවින් ඉහත සඳහන් ප්‍රදේශයෙන් පැමිණෙන මිනිස්සුන් කොළරා රෝගයට අත් එන්නත් කිරීමේ සහතිකයට අමතරව ලංකාවේ කිසියම් වරායක ගොඩබාන අමුත් මාළු, කරවලවෙන් ආවරණවූ මාළු (ෂෙල් ෆිෂ්), එළවළු, පලතුරු, හකුරු, මිස්කට් (එසේ නැතහොත් කොළරා රෝගය පැතිර යෑමට අදාල වෙන වෙනත් ආහාර ද්‍රව්‍යයන් ලංකාවට ගෙන ඒම තහනම් කර ඇත.

ඉහත සඳහන් ප්‍රදේශය කොළරා රෝගයෙන් තොරවූ වහාම තවත් දැන්වීමක් පළ කරනු ලැබේ.

අධ්‍යක්ෂ,
නිරෝධායන දෙපාර්තමේන්තුව.

නිරෝධායන කාර්යාලය,
කොළඹ, 1965.10.30.

11-227

---

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනය

### ආඥපනතේ (402 අධිකාරය) 71 වෙනි වගන්තිය යටතේ කරගත් සම්මතයයි

1965. 8. 25 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කරගත් බව මෙයින් දැනුම් දෙමි.

මහනුවර දිස්ත්‍රික්කයේ ඵලගුනු කෝරළයේ පදිංචි කල්ලෝර මුදියන්සේලාගේ බංගිරි බණ්ඩා සහ ලියනදෙණිය ආරච්චිගේ අප්පුහාමිද ගමිලගේ පදිංචි ලියනදෙණිය ආරච්චිගේ මුතුමැණිකා විසින් මහනුවර ප්‍රනොතාරිස් වන ආර්. ආර්. පින්තු විසින් 1952 දෙසැම්බර් 3 වෙනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනය නමට ලියා සහතික කරණ ලද අංක 523 දරණ උකස්කරයේ ප්‍රකාර මුදල් ගෙවීම පැහැරහැර ඇති හෙයින්ද දැනට එකී උකස්කරයේ ප්‍රකාර රුපියල් එක්දහස් එකසිය හැටහයක් සහ ශත හැත්තෑවක් (රු. 1,166/70ක්) ආයතනයට ගෙවිය යුතුව ඇති හෙයින්ද ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ ආඥපනත (1956 සංශෝධිත නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 402 අධිකාරය) යටතේ ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව එකී මහනුවර ප්‍රනොතාරිස් ආර්. ආර්. පින්තු විසින් 1952. 12. 3 වෙනි දින ලියා සහතික කරණලද අංක 523 දරණ උකස්කරයේ ප්‍රකාර උකස්කළ දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරු වන ලොසිඩි ජේරම්ක්‍රම් මහතා විසින් එකී මුදලවූ රු. 1,166/70ක් ද 1965.6.1 දින සිට විකිණෙනතුරු සියයට 6½ බැගින් එකතුවන පොලිය දින දක්වා රු. 852/19ක් වන මුළු මුදලට පොළියද වෙන්දේසි ගාස්තුද අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යටමත කරගන්නා ලදී.

හි. සා. පෙ. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

292, ගාලු පාර,
කොළඹ 3.
1965. 10. 13 දා.

11-49

---

## 1966 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත් කිරීම

### නුවරඑළිය දිස්ත්‍රික්කය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ තුවක්කු තබා ගැනීමට බලපත්‍ර 1966 වර්ෂය සඳහා අළුත් කිරීම 1965 නොවැම්බර් මස 10 වෙනි දින සිට ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය ආදායම් නිළධාරීන් විසින් කරගෙන යනු ලැබේ. තුවක්කු තබා ගැනීම සඳහා නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ප්‍රථම අළුත් කළ යුතුය.

2. තුවක්කු බලපත්‍ර අළුත් කිරීමේදී 1965 වර්ෂයට අයත් බලපත්‍රය සමග ඊට අයිති තුවක්කුව ද බලපත්‍ර අළුත් කරන නිළධාරී හමුවේ ඉදිරිපත් කළ යුතුය.

3. 1965 දෙසැම්බර් 31 වෙනි දිනට පසු බලපත්‍ර අළුත් කරන අය, බලපත්‍ර ගාස්තුව හා ඊට සමාන දඩ මුදලක් ගෙවිය යුතුය. 1966 මාර්තු 31 වෙනි දින දක්වා ප්‍රාදේශීය ආදායම් නිළධාරීන් විසින් ද්විගුණ දඩ මුදල අයකර බලපත්‍ර අළුත් කරනු ලැබේ.

4. යම් තුවක්කු බලපත්‍රයක් 1966 වර්ෂයට අළුත් නොකිරීමට බලාපොරොත්තුවේ නම්, එකී බලපත්‍රය හා ඊට අදාල තුවක්කුවද, බලපත්‍ර අළුත් කරන නිළධාරී නැතහොත් මෙම කාර්යාලයට 1965 දෙසැම්බර් 31 වෙනි දිනට හෝ ඊට පෙර භාරදිය යුතුය.

5. 1966 මාර්තු 31 වෙනි දිනට පෙර අළුත් නොකරන සෑම බලපත්‍රයක් සඳහාම නීති මාර්ගයෙන් ක්‍රියා කරනු ලැබේ.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු
නුවරඑළියේ ආණ්ඩුවේ ඒජන්ත.

1965 ඔක්තෝබර් මස 26 වෙනි දින,
නුවරඑළිය කච්චේරියේදීය.

11-32

## 1966 වර්‍ෂයට තුවක්කු බලපත්‍ර අළුත් කිරීම

### යාපනය දිස්ත්‍රික්කය

තුවක්කු හිමියන් විසින් 1966 වර්‍ෂයට අවසර පත්‍ර (ලැයිසන්) අළුත් කිරීම පිණිස 1965 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දින දක්වා ඉල්ලුම් කළ යුතුයි. 1965 අවසර පත්‍රයද මේ සමග එවිය යුතුයි. එම අවසර පත්‍රය නොමැති නම්, එක එක අවසර පත්‍රයට රුපියල (රු. 1.00) බැගින් වැඩිපුර මුදලක් ගෙවිය යුතුයි. මේ වැඩිපුර මුදල නැතිවූ අවසර පත්‍රය වෙනුවෙන් නිකුත් කරන සහතිකයට අයකළ යුතු ගාස්තුව පිණිස වෙයි.

2. තුවක්කු සඳහා ඇති සෑම බලපත්‍රයක්ම 1965 දෙසැම්බර් මස 31 වෙනිදාට පෙර 1966 වර්‍ෂය සඳහා අළුත් කර ගත යුතුයි. බලපත්‍ර අළුත් කර ගැනීමේදී 1965 වර්‍ෂය සඳහා ඇති බලපත්‍රයද, සෝදිසි කිරීම සඳහා එම තුවක්කුවද ආදායම් නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

3. 1965 දෙසැම්බර් මස 31 වෙනිදාට ප්‍රථමයෙන් නව වර්‍ෂය සඳහා අළුත් බලපත්‍රයක් නොගන්නා අයට බලපත්‍රයේ ගාස්තුවට සමාන දඩ මුදලකට යටත් වන්නට සිදුවේ. 1966 මාර්තු මස 31 වෙනි දින දක්වා ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් ඉහත කී දඩ මුදල් අයකර බලපත්‍ර අළුත් කරනු ලැබේ. 1966 මාර්තු මස 31 වෙනි දිනට ප්‍රථම බලපත්‍ර අළුත් නොකළ අයට නීති මාර්ගයෙන් දඬුවම් පමුණුවනු ලැබේ.

4. යම් කිසි හේතුවක් නිසා තුවක්කු බලපත්‍රයක් අළුත් කර නොගන්නේ නම් 1965 වර්‍ෂය වෙනුවෙන් නිකුත් කර ඇති බලපත්‍රයද, එම බලපත්‍රය නිකුත් කරන ලද නිලධාරි තැන වෙත භාර දිය යුතුයි.

1966 වර්‍ෂයට ගෙවිය යුතු ගාස්තු පහත දැක්වේ :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| 1. බෙහෙත් කොටන තනිකානුවේ තුවක්කුවකට | ... | 1 | 00 |
| 2. බෙහෙත් කොටන කානුදෙකේ තුවක්කුවකට | ... | 2 | 00 |
| 3. තනිකානුවේ පතරොම් තුවක්කුවකට | ... | 2 | 50 |
| 4. කානුදෙකේ පතරොම් තුවක්කුවකට | ... | 5 | 00 |
| 5. කානුතුනේ පතරොම් තුවක්කුවකට | ... | 7 | 50 |
| 6. රයිෆලයකට ... ... | ... | 10 | 00 |
| 7. පිස්තෝලයකට හෝ රිවෝල්වරයකට | ... | 25 | 00 |

එන්. ඩී. ජයවීර,
යාපනයේ දිසාපති.

1965 ඔක්තෝබර් මස 27 වෙනි දින,
යාපනයේ දිසාපති කාර්යාලයේදීය.

11-126

---

## 1966 වර්‍ෂයට තුවක්කු බලපත්‍ර අළුත් කිරීම

### පොලොන්නරු දිස්ත්‍රික්කය

1966 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අළුත් කිරීම 1965 නොවැම්බර් මස 15 වැනි දින සිට ආරම්භ වේ. බලපත්‍ර අයිතිකරුවන් ඔවුන් පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් බලපත්‍ර අළුත් කරගත යුතුයි. එම කාර්යාලය මගින් 1966 මාර්තු මස 31 වැනි දින දක්වා බලපත්‍ර අළුත් කෙරේ. එයින් පසු අළුත් කෙරෙන්නේ පොලොන්නරුව කච්චේරිය මගින්ය. ඒ ඒ ප්‍රදේශ භාර ආදායම් නිලධාරීන්ගේ ලිපිනයන් පහත සඳහන් වේ:—

(1) මැද හා එගොඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි, කදුරුවෙල, පොලොන්නරුව.

(2) සිංහල පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි, හිඟුරක්ගොඩ.

2. බලපත්‍ර ගාස්තුව වශයෙන් මුද්දර භාර ගනු නොලැබේ. පැරණි බලපත්‍ර නැතිවී නම් ඒ වෙනුවට රුපියලක් ගෙවා බලපත්‍ර පිටපතක් ප්‍රාදේශීය ආදායම් නිලධාරිගෙන් ලබාගත යුතුයි. පැරණි බලපත්‍රය හෝ එහි පිටපතක් ඉදිරිපත් නොකළ අයට අලුත් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබේ. ඉහත සඳහන් කාල සීමාව තුලදී බලපත්‍ර අළුත් කිරීම පොලොන්නරුව කච්චේරියේ දී කරනු නොලැබේ. 1965 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රථමයෙන් නව වර්‍ෂය සඳහා බලපත්‍රයක් නොගත් අයට බලපත්‍ර ගාස්තුවට සමාන දඩ මුදලකට යටත්වීමට සිදුවේ. 1966 මාර්තු මස 31 වැනිදට ප්‍රථමයෙන් බලපත්‍ර අළුත් නොකළ අයට නීති මාර්ගයෙන් දඬුවම් පැමිණවීමට ඉඩ ඇත.

3. අළුත් කිරීමට ඉදිරිපත් කරන බලපත්‍රවලට අයත් තුවක්කු එම බලපත්‍රය නිකුත් කිරීමට පෙර මවිසින් බලය දී ඇති නිලධාරීතැන වෙත පරීක්‍ෂාකර බැලීම සඳහා ඉදිරිපත් කළ යුතුයි. යම් තුවක්කුවක් පාවිච්චිකළ නොහැකි තත්ත්වයක තිබේනම් 1965 වර්‍ෂයට නිකුත් කරන ලද බලපත්‍රයත් සමග ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනට 1965 දෙසැම්බර් මස 31 වෙනිදාට හෝ ඊට පෙර භාර දිය යුතුය. එසේ නොකළහොත් 1966 වර්‍ෂයට බලපත්‍රයක් ලබාගැනීමට සිදුවේ.

පී. බී. දිසානායක,
පොලොන්නරුවේ දිසාපති වෙනුවට.

1965 ඔක්තෝබර් මස 30 වැනි දින,
පොලොන්නරුවේ දිසාපති කාර්යාලයේ දීය.

11-159

---

## 1966 වර්‍ෂයට තුවක්කු බලපත්‍ර අළුත් කිරීම

### මඩකලපු දිස්ත්‍රික්කය

මඩකලපු දිස්ත්‍රික්කයේ තුවක් තබා ගැනීමේ බලපත්‍ර 1966 වර්‍ෂය සඳහා අළුත් කිරීම සහ අලුත් බලපත්‍ර නිකුත් කිරීම, 1965 නොවැම්බර් 15 දින සිට 1966 මාර්තු 31 දින දක්වා වූ කාලය තුළදී ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් කරන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් දන්වනු ලැබේ. එහෙයින් ඒ සඳහා සියලුම ඉල්ලුම් පත්‍ර ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුයි. හැකි පමණ ඉක්මණින් බලපත්‍ර අළුත් කර ගන්නා ලෙස මහජනයාට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

තවද, බලපත්‍ර නිකුත් කිරීමට පෙර, බලපත්‍ර අළුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් සමග තුවක්කුද, මා වෙනුවෙන් බලපත්‍ර අළුත් කරන නිලධාරියා වෙත, පරීක්‍ෂා කර බැලීම සඳහා ඉදිරිපත් කළ යුතු බවද මෙයින් දන්වනු ලැබේ.

තුවක්කු ළඟ තබා ගැනීමේ සියලුම බලපත්‍රවල වලංගු කාලය 1965 වර්‍ෂය අවසානයේදී අවසාන වන බව දන්වන අතරම 1966 වර්ෂය සඳහා 1965 දෙසැම්බර් මස 31 දිනට පෙර ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කාර්යාල වලින් ඒවා අළුත් කළ යුතු බව මෙයින් දන්වනු ලැබේ. එම දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර, බලපත්‍ර ගාස්තුව සමාන දඩයකටද යටත් වේ.

1965 නොවැම්බර් 15 දින සිට 1966 මාර්තු 31 දින දක්වාවූ කාලය තුළදී අළුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර, මඩකලපු කච්චේරියේදී භාර ගනු නොලැබේ.

1966 මාර්තු 31 දින වන විට අළුත් නොකළ සෑම බලපත්‍රයක් සඳහාම නීති මාර්ගයෙන් කටයුතු කරන බවද මෙයින් දන්වමි.

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර,
මඩකලපු දිස්ත්‍රික්කයේ වැඩබලන රජයේ
දිසාපති.

1965.10.27 දින,
මඩකලපු කච්චේරියේදීය.

11-166

---

## 1958 අංක 1 දරන කුඹුරු පනතේ 38ආ (2) වගන්තිය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ පළමු මීවැව ගොවි කාරක සභා බලධාරී ප්‍රදේශයේ 1958 අංක 1 දරණ කුඹුරු පනත යටතේ ගොවි කාරක සභාවක බලතල, යුතුකම් හෝ කාර්‍යයන් සියල්ලක්ම හෝ ක්‍රියාවන්යි යෙදවීම සහ ඉටු කිරීම පිණිස ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරි ආර්. ඇස්. පී. ධර්මරත්න මහතාහට බලය පවරා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇල්. ඇන්. ද ඇල්. බණ්ඩාරනායක,
නියෝජ්‍ය කොමසාරිස්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

කොළඹ 7,
තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

11-167

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### දුම්රිය හරස් පාරවල් අළුත් වැඩියා කිරීම

ප්‍රධාන මාර්ගයේ මීරිගම හා අඹේපුස්ස දුම්රිය ස්ථාන අතර සැ. 31, ද. 42 හි පස්යාල හිරිවුල්ල පාර වැටි ඇති ස්ථානයේ පිහිටි දුම්රිය හරස් පාර අළුත් වැඩියා කරනු ලබන හෙයින් 1965.11.14 වෙනි ඉරිදා පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා අඩ වශයෙන් ද, 1965.11.14 වෙනි ඉරිදා පස්වරු 6.00 සිට 1965.11.15 වෙනි සඳුදා පෙරවරු 6.00 දක්වා සම්පූර්ණ වශයෙන් ද රථවාහන ගමනාගමනයට වසා තබනු ලැබේ. මේ කාලය තුළදී රථවාහනවලට පහත සඳහන් පාරවල් ප්‍රයෝජනයට ගත හැක :—

(1) මීරිගම-මීගමුව මහා මාර්ගයෙන් දිවෙන නාල්ල පාර,

(2) මීරිගම-වරකාපොල පාර, බෝතලේ හරහා කීනදෙනිය කන්ඩලම පාර, කීනදෙනිය සහ පිහිසියාල පාර—බර වාහන සඳහා,

(3) හකුඩුකුඹුර නගර සභා පාර—සැහැල්ලු වාහන සඳහා.

ඇන්. ඒ. වෛත්‍යලිංගම්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

11-19

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### දුම්රිය හරස් පාරවල් අළුත් වැඩියා කිරීම

උතුරු දුම්රිය මාර්ගයේ මල්ලාකම් හා තෙල්ලිප්පලෙයි යන දුම්රිය ස්ථාන අතර සැ. 252, ද. 46, පු. 83 හි එර්ලාලෙයි පාර වැටී ඇති ස්ථානයේ පිහිටි දුම්රිය හරස් පාර අළුත් වැඩියා කරනු ලබන හෙයින් 1965.11.17 වෙනි බදාදා පස්වරු 6.00 සිට 8.00 දක්වා අඩ වශයෙන් ද, 1965.11.17 වෙනි බදාදා පස්වරු 8.00 සිට 1965.11.18 වෙනි බ්‍රහස්පතින්දා දහවල් 12.00 දක්වා සම්පූර්ණ වශයෙන් ද රථ වාහන ගමනාගමනයට වසා තබනු ලැබේ.

මේ කාලය තුළදී රථ වාහන ගමනාගමනය සැ. 252, ද. 29. පු. 79 හි පිහිටි දුම්රිය හරස් පාරෙන් හරවා යවනු ලැබේ.

ඇන්. ඒ. වෛත්‍යලිංගම්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

11-3

---

## රජයේ දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය මාර්ගය හරහා වැටී ඇති හරස් පාර අළුත්වැඩියා කිරීම

මාතලේ දුම්රිය මාර්ගයේ සැ. 4, දම්. 46 දරණ ස්ථානයේ පිහිටි, මහනුවර සිට ලේඩි මැනින් ඩ්‍රයිව් දක්වා දිවෙන කන්දේ විදිය පාර දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානය 1965.11.13 වෙනි දින පෙරවරු 7.00 සිට 1965.11.14 වෙනි දින පෙරවරු 3.00 දක්වා අළුත්වැඩියා කරනු ලබන හෙයින්, 1965.11.13 වෙනි දින පෙරවරු 7.00 සිට පස්වරු 9.00 දක්වා ප්‍රවේශයෙන් වාහන ගමනාගමනයට ඉඩදී, 1965.11.13 වෙනි දින පස්වරු 9.00 සිට 1965.11.14 වෙනි දින පෙරවරු 3.00 දක්වා සම්පූර්ණයෙන් වසා තබනු ඇත. මෙම කාලය තුළදී සියළුම රථ වාහන මහසියාව සුසාන භූමිය පාර හරහා ගමන් කරණු ඇත.

ඇන්. ඒ. වෛත්‍යලිංගම්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

11-62

---

## දැන්වීමයි

### මා/ශ්‍රී විජය පිරිවෙන, පාතකඩ, මොරවක

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පාතකඩ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස 1963.6.10 වෙනි දින සිට තාවකාලික වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ඊ. ඇස්. පී. ඒ. 53.
1965. 10. 22 දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

11-6

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ දැළවත.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| **එක් කොටසක්** ... ... ... | 27 50 | ... | 40 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 17 50 | ... | 23 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 25 0 | ... | 33 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට |
|---|---|---|---|
| | රු. ශ. | | රු. ශ. |
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 30 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 60 | .. | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 15 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... .. | 0 30 | ... | 0 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි